### 2.1.2 I ප්‍රශ්න පත්‍රය

- අංක **1** සිට **3** තෙක් ප්‍රශ්නවල එක් එක් වාක්‍යයෙහි තදකළු අකුරින් මුද්‍රිත කොටසේ අර්ථයට **වඩාත් සමීප අර්ථය** දෙන වචනය තෝරන්න.

1. රාත්‍රිය මුළුල්ලෙහි ඇදහැළුණු **අනෝරා වැස්ස** නිසා තාත්තා හේනේ පැලට වී නිරාහාරව නිදගත්තේ ය.
   (1) අගක් මුලක් නැති වැස්ස (2) වාරකන් වැස්ස
   (3) මඳ වැස්ස (4) නැවැත්වීමක් නොමැති වැස්ස

2. කුඩා කල සිට ම **පණට පණ මෙන්** සිටි දෙමිතුරෝ ඉතා ඉහළින් ම විභාගයෙන් සමත් වූ හ.
   (1) ඉතා දැහැමිව (2) නොවෙනස්ව
   (3) සජීවී ලෙස (4) ඉතා හිතවත්ව

3. සොරා සෙවීම සඳහා පොලීසිය විසින් කරන ලද්දේ **කුණිස්සන්ට දැල් දැමීම** වැනි ක්‍රියාවකි.
   (1) වටකර ඇල්ලීම (2) දැල් අතර කුනිස්සන් දැමීම
   (3) නිෂ්ඵල උත්සාහයක් දැරීම (4) වෙහෙසකර උත්සාහයක් දැරීම

- අංක **4** සිට **7** තෙක් ඇති ප්‍රශ්නවල හිස්තැන්වලට **වඩාත් සුදුසු** පදය තෝරන්න.

4. බොහෝ රසවත් නිර්මාණ බිහිවන්නේ නිර්මාණකරුවාගේ ………………… ප්‍රතිභාව හේතුවෙනි.
   (1) නෛසර්ගික (2) ප්‍රාසංගික
   (3) ආකස්මික (4) වෛකල්පික

5. රටේ ………………… වෙනුවෙන් කැපවීම අප සැමගේ ම යුතුකමකි.
   (1) අනුමතිය (2) උන්නතිය
   (3) පරිණතිය (4) අභිමතිය

6. ඕනෑම කාර්යයක් සාර්ථක වීමට නිරන්තර ………………… අත්‍යවශ්‍ය වේ.
   (1) පරීක්ෂණය (2) පර්යේෂණය
   (3) අධීක්ෂණය (4) සමීක්ෂණය

7. වැටුප් ………………… ඉවත් කරන්නැයි ඉල්ලීම් කරමින් සේවක පිරිස උද්ඝෝෂණය කළහ.
   (1) විෂමතා (2) ඵලදායිතා
   (3) සංකුලතා (4) අවශ්‍යතා

- අංක **8** සිට **10** තෙක් ඇති ප්‍රශ්නවල සෑම පදයක ම අක්ෂර වින්‍යාසය **නිවැරදිව** යෙදී ඇති වරණය තෝරන්න.

8. (1) විශ්මය, පුස්තකාලය, විශ්වාශය, ප්‍රදර්ශනය (2) විශ්ලේසණය, ශ්‍රවණාගාරය, පර්යේෂණය, ජලාපවහණය
   (3) නිෂ්කලංක, නිශ්ශබ්ද, සංගායණාව, තීරණය (4) සමස්ත, ශිෂ්ටාචාරය, කනිෂ්ඨ, ගවේෂණය

9. (1) අබිවාදනය, නිශ්ක්‍රීය, දෘශ්‍ය, ප්‍රශංසාව (2) ස්වයංපෝෂණය, සැණකෙළිය, තාක්ෂණය, පරිභ්‍රමණය
   (3) ස්ථූප, වත්පිළිවෙත්, පෞරානික, මහෝපාධ්‍යාය (4) නීත්‍යානුකූල, පරිගණක, ශ්‍රේෂ්ඨ, ප්‍රස්ථාරය

10. (1) වෛද්‍යාචාර්ය, සෞන්දර්යය, භූනය, පිළියෙල (2) මිථ්‍යාව, දිළිඳු, ජයග්‍රහණය, සංදර්ශණය
    (3) ප්‍රතිමා, ඖෂධ, දීර්ග, නිපුණත්වය (4) ගගණගාමී, ඓතිහාසික, භීෂණය, මිනිබරණ

11. අකාරාදි පිළිවෙළට නම් යෙදී ඇති වරණය තෝරන්න.
    (1) හංස සන්දේශය, අමාවතුර, දළඳ සිරිත, පූජාවලිය
    (2) ගිරා සන්දේශය, බුත්සරණ, බුදුගුණාලංකාරය, සඳකිඳුරුදාකව
    (3) මඩොල්දූව, විජයබාකොල්ලය, රන්මුතුදූව, ගම්පෙරළිය
    (4) කාව්‍යශේඛරය, බෝධිවංශය, ජාතක පොත, ධර්මප්‍රදීපිකාව

- අංක **12, 13** ප්‍රශ්නවල එක් එක් වාක්‍යයේ ඉදිරිපත් කර ඇති ව්‍යාකරණ විග්‍රහය අතුරෙන් **වැරදි** ව්‍යාකරණ විග්‍රහය සහිත වාක්‍යය තෝරන්න.

12. (1) 'ගුරුවරයා විසින් සිසුහු යහමග යැවෙති.' යන වාක්‍යය කර්මකාරක වාක්‍යයකි.
    (2) 'ඇත් පන්තිය පෙරහැරේ ගමන් කරති' යන වාක්‍යයේ ඇත් පන්තිය යනු සමූහාර්ථවාචී නාම පදයකි.
    (3) 'මහගමසේකර මහතා ප්‍රවීණ ගීතරචකයෙක් විය' යන වාක්‍යය ද්විත්ව උක්ත පද යෙදුණු වාක්‍යයකි.
    (4) 'වෛද්‍යවරු රෝගීන් සුවපත් කරති' යන වාක්‍යයේ රෝගීන් යනු උක්ත පදයකි.

13. (1) 'සිසුවියක් නොනවත්වා ප්‍රශ්න නගන්නීය' යන වාක්‍යයේ සිසුවියක් යනු අනියමාර්ථ ඒකවචන නාම පදයකි.
(2) 'කුණාටුවට හසු වූ මහාවෘක්ෂ මිහිතලය සිපගත්තේ ය' යන වාක්‍යයේ මහාවෘක්ෂ යනු උක්ත නාම පදයකි.
(3) 'මම දෙගුරුන් නමදිමි' යන වාක්‍යයේ මම යනු ප්‍රථම පුරුෂ ඒකවචන නාම පදයකි.
(4) 'දෙවියන් විසින් මිනිස්සු රැකෙති' යන වාක්‍යයේ විසින් යනු නිපාත පදයකි.

14. එක් එක් පේළියේ මුලින් දැක්වෙන පදයේ අර්ථයට **සමානාර්ථයක්** දෙන පදයක් සහිත පද පේළිය තෝරන්න.
(1) අභිප්‍රාය - අදහස, අභිමානය, ස්තුති කිරීම, ඉදිරිපත් කිරීම
(2) ක්ෂීණ - තියුණු, වැරදුණු, වැටුණු, දියුණු
(3) පර්යන්තය - දුර්වල, උදාසීන, කෘශ, ආරම්භය
(4) දිවාකර - නිශාචර, තරිඳු, සිකුරු, හිමකර

15. එක් එක් පේළියේ මුලින් දක්වෙන පදයට **විරුද්ධාර්ථයක්** දෙන පදයක් සහිත පද පේළිය තෝරන්න.
(1) මනඃකල්පිත - මනස්ගාත, උපකල්පිත, අභිමත, මනෝභාව
(2) මකුටය - ඔටුන්න, ආසනය, මණ්ඩපය, තිලකය
(3) ප්‍රවීණ - නවීන, ප්‍රසිද්ධ, ආධුනික, බුහුටි
(4) ක්ෂුද්‍ර - කුඩා, පුංචි, සුළු, සූක්ෂම

- අංක **16** සිට **18** තෙක් වාක්‍යවල **තද කළු අකුරින්** මුද්‍රිත කොටස් කවර ව්‍යාකරණ ප්‍රවර්ගයකට අයත්දැ'යි තෝරන්න.

16. භික්ෂූන් වහන්සේ පිරිස **පංචශීලයෙහි** පිහිටුවූහ.
(1) විශේෂණ සමාස (2) දකාරාර්ථ සමාස (3) අන්‍යාර්ථ සමාස (4) අව්‍යය සමාස

17. සුභාසිතය අපේ පැරණි උපදේශාත්මක **කියමන්** හඳුන්වා දෙන කෘතියකි.
(1) නිපාත (2) සමාස (3) සන්ධි (4) කෘදන්ත

18. **කැහැටු** බල්ලකු දකීමෙන් මා තුළ මහත් අනුකම්පාවක් ඇති විය.
(1) සමාස (2) තද්ධිත (3) නිපාත (4) උපසර්ග

- අංක **19** සහ **20** ප්‍රශ්නවල එක් එක් පේළියේ මුලින් දී ඇති පදය නිවැරදි ව **විසන්ධි** කොට ඇති වරණය තෝරන්න.

19. (1) දකුණත - දකුණ + අත (2) ඔවුනොවුන් - ඔවුන් + ඔවුන්
(3) පුනරාගමනය - පුනරා + ගමනය (4) ශ්‍රවණාගාරය - ශ්‍රවණා + ගාරය

20. (1) ජීවනෝපාය - ජීවන + උපාය (2) අත්‍යවශ්‍ය - අත්‍ය + අවශ්‍ය
(3) ස්ථානෝචිත - ස්ථාන + ඕචිත (4) ග්‍රාමාරක්ෂක - ග්‍රාම + අරක්ෂක

21. ඇලපිල්ල, පාපිල්ල, ඉස්පිල්ල සහ ගයනුකිත්ත යන පිල්ලම් පිළිවෙළින් යෙදුණු පද දැක්වෙන පේළිය තෝරන්න.
(1) කාර්යාලය, අනුවාදය, රක්ෂණය, විස්තෘත (2) සාංකාව, විරාගය, සංසිද්ධිය, ඖෂධ
(3) සංලාපය, පර්යේෂණය, සංවර්ධනය, කෞතුක (4) රාත්‍රිය, අංශුක, පරිකල්පන, ඖදාර්යය

- අංක **22** සිට **24** තෙක් දී ඇති එක් එක් ප්‍රකාශයෙහි අදහසට **වඩාත් ගැළපෙන** ප්‍රස්තාව පිරුළ තෝරන්න.

22. තමන්ට නුපුරුදු කාර්යයක් කිරීමට ගොස් අපහසුතාවට පත්වීම
(1) ගහෙන් වැටුණු මිනිහට ගොනා ඇන්නා වගෙයි (2) අනුන්ට කැපූ වලේ තමන් වැටුණා වගෙයි
(3) ගමරාල සිල් ගත්තා වගෙයි (4) ඉඟුරු දීලා මිරිස් ගත්තා වගෙයි

23. කිසියම් දෙයක යථා තත්ත්වය නොදන විවිධ අදහස් පළ කිරීම
(1) ඇටිකෙහෙල් කෑ උගුඩුවා වගෙයි (2) පරංගියා කෝට්ටේ ගියා වගෙයි
(3) කතරගම ගිහින් කිරි වෙහෙර නොදක්කා වගෙයි (4) අන්ධයින් අලියාගේ හැඩරුව කීවා වගෙයි

24. වැරදි ක්‍රියාවක නිරත වූ පුද්ගලයා ඒ පිළිබඳ ව නිරන්තරයෙන් පසුතැවීම
(1) අබ කෑ මිනිහාගේ නාහෙ දන්නා වගෙයි (2) කපන්ට බැරි අත ඉඹින්නා වගෙයි
(3) දැළි පිහියෙන් කිරි කන්නා වගෙයි (4) කටුස්සාගේ කරේ රත්තරන් බැන්දා වගෙයි

- අංක **25, 26** ප්‍රශ්න හා බැඳුණු කොටස්වල **අර්ථය නිවැරදි ව යෙදී ඇති** වරණය තෝරන්න.

25. ආචාරීන්ගේ බස මරුත්තු නොකෙරෙමි.
(1) කම්මල්කරු කියන බස නො ඉවසමි. (2) ගුරුවරයා කියන දෙය කඩ නො කරමි.
(3) ගුරුවරයා කියන බසට බාධා නො කරමි. (4) කම්මල්කරුගේ භාෂාව නොතේරෙන බව නො කියමි.

26. නදනා දන නෙත් පැහැ ලණු ලා සිට
(1) සතුටට පත් ජනයා තම නෙත්වල පැහැය නමැති යොත් දමාගෙන
(2) නාද කරන්නා වූ ජනයා නේත්‍ර ප්‍රසාදය නම් යොත දමාගෙන
(3) බොහෝ ධනය ඇති ජනතාව නේත්‍ර වර්ණ කඹ දමාගෙන
(4) සතුටට පත් ධනවත් ජනයා නෙත්වල පැහැය නමැති යොත් ලා ගෙන

- අංක **27, 28** ප්‍රශ්නවල තදකළු අකුරින් මුද්‍රිත කොටස් වෙනුවට යෙදිය හැකි **වඩාත් ම ගැළපෙන** තනිපදය තෝරන්න.

27. දේශකතුමා දක්වූ අදහස් **කවරකාලයකට වුවත් ගැළපෙන** බව මගේ අදහසයි.
(1) සාර්වකාලීන (2) යාවත්කාලීන
(3) සර්වව්‍යාපී (4) සාර්වභෞමික

28. තමන්ගේ **අතීත ක්‍රියාකලාපයන් යළිත් සිහිපත් කිරීම** මගින් වඩාත් යහපත් අනාගතයක් උදකර ගත හැකි ය.
(1) පරීක්ෂණය (2) ප්‍රත්‍යවේක්ෂණය
(3) ගවේෂණය (4) පුනරාගමනය

- අංක **29** සිට **33** තෙක් එක් එක් ප්‍රශ්නයෙහි දී ඇති ප්‍රකාශ අතුරෙන් **නිවැරදි** වරණය තෝරන්න.

29. වස් දඩු බිහු කොවුල් වීණා නද මියුරු
රැස්වූ සෙයින් සත්සර ගී රස සොඳුරු
අස්වන ලියන් දක ලිය කිඳුරඟන පුරු
තොස්කර තසිත සවනත නුවනත මිතුරු
ඉහත සඳහන් කවියේ 'අස්වන ලියන්' යන්නෙන් අදහස් කරන්නේ,
(1) ඉවත්ව යන කාන්තාවන් ය. (2) අස්වනු නෙළන කාන්තාවන් ය.
(3) ඇසීමට සලස්වන කාන්තාවන් ය. (4) හසුකරන කාන්තාවන් ය.

30. හින්දු භක්තිකයන්ගේ තෛපොන්ගල් උත්සවය වනාහි,
(1) දෙවිවරුන් පිදීම සඳහා පවත්වනු ලබන්නකි. (2) පරණ අවුරුද්ද සැමරීම සඳහා පවත්වනු ලබන්නකි.
(3) හිරු දෙවියන් පිදීම සඳහා පවත්වනු ලබන්නකි. (4) කතරගම දෙවියන් පිදීම සඳහා පවත්වනු ලබන්නකි.

31. ජාලිය සහ කෘෂ්ණජිනා යන චරිතද්වය හමුවන්නේ,
(1) වෙස්සන්තර ජාතක කථාවෙහි ය. (2) උම්මග්ග ජාතක කථාවෙහි ය.
(3) ලද දෙව්දුවගේ වත කථා වස්තුවෙහි ය. (4) වේදබ්භ ජාතක කථාවෙහි ය.

32. ලෝක ස්වභාවය ඉක්මවා යම් කිසිවක් ගැන කෙරෙන වර්ණනය,
(1) උපමාලංකාරයයි. (2) ස්වභාවෝක්ති අලංකාරයයි.
(3) රූපකාලංකාරයයි. (4) අතිශයෝක්ති අලංකාරයයි.

33. කුඹුරු ගොවිතැනේදී "බිං නැගීම" යනුවෙන් හැඳින්වන්නේ,
(1) පළමුවන සී සෑම ය. (2) වැපිරීම ය.
(3) පෝරුගෑම ය. (4) අස්වනු නෙළීම ය.

34. **අනියමාර්ථ නිත්‍ය බහුවචන නාම පදයක්** උක්තය වශයෙන් යෙදී ඇති වරණය තෝරන්න.
(1) සමහරෙක් රැස්වීමට සහභාගි වූහ. (2) බිඟුරැළ මල්වල පැණි උරමින් පියාඹති.
(3) පියාණෝ දරුවන්ට ඔවදන් දෙති. (4) රජ්ජුරුවෝ උයනට සම්ප්‍රාප්ත වූහ.

35. **උපසර්ග** පදයක් සහිත වරණය තෝරන්න.
(1) සාරධර්ම රැකගැනීම සියලුදෙනාගේ වගකීමකි.
(2) රාජ්‍ය සම්මාන සඳහා නවකතා පොත් තේරීම සාහිත්‍ය අනුමණ්ඩලයේ වගකීමකි.
(3) ආයුර්වේද ඖෂධ මගින් බොහෝ ලෙඩරෝග සුව කළ හැකි ය.
(4) දිනපතා පුවත්පත් කියවීම දැනුම වර්ධනයට හේතු වේ.

- අංක **36, 27** ප්‍රශ්නවල මුලින් ඉදිරිපත් කර ඇති පාඨ සඳහා වඩාත් **සමීප අර්ථය** දෙන වරණය තෝරන්න.

36. පෘථිවිතලය මත ජීවය ඇතිවන්නට පෙර, දීර්ඝකාලීන රසායන පරිණාමයක් සිදු වී ඇති බවට ජීව රසායන විද්‍යාඥයෝ මත පළ කරති.
    (1) පොළොව මත ජීවය ඇති වී ඇත්තේ රසායන ක්‍රියාවලියෙන් පසුව යි.
    (2) දීර්ඝකාලීනව සිදු වූ රසායන ක්‍රියාවලියකින් අනතුරුව පොළොව මත ජීවය ඇති වී ඇති බව රසායන විද්‍යාඥයින්ගේ මතය යි.
    (3) ජීව රසායන විද්‍යාඥයින්ගේ මතය වන්නේ පෘථිවියේ ජීවය ආරම්භවන්නට කලින් දිගුකලක් තිස්සේ ක්‍රමික රසායන ක්‍රියාවලියක් සිදුව ඇති බව යි.
    (4) ජීව රසායන විද්‍යාඥයින්ගේ මතයට අනුව පෘථිවිය මත ජීවය ඇතිවීම සඳහා රසායන ක්‍රියාවලියක් හේතු වී ඇත.

37. නවීන තාක්ෂණික මෙවලම් මිනිසාගේ යහපත වෙනුවෙන් යොදාගත යුතු වුවත් වර්තමානයේ එය මිනිසාගේ යහපතට වඩා අයහපතට හේතු වී ඇති බව පෙනේ.
    (1) නවීන තාක්ෂණික මෙවලම් භාවිතය මිනිසාගේ යහපත සඳහා විය යුතු ය.
    (2) වර්තමානයේ භාවිත වන තාක්ෂණික මෙවලම් මිනිසාට අයහපත උදකර යි.
    (3) නවීන තාක්ෂණික මෙවලම් මිනිසාගේ කාර්යයන් පහසු කිරීමට වඩා විවිධ අපහසුතා ඇති කිරීමට හේතු වී ඇත.
    (4) මිනිසාගේ යහපත වෙනුවෙන් නවීන තාක්ෂණික මෙවලම් යොදගත යුතු වුවත් අද වන විට එය මිනිසාට අයහපත ද උදා කර දී ඇත.

- අංක **38** සිට **40** තෙක් එක් එක් ප්‍රශ්නයෙහි දී ඇති වාක්‍ය හතර අතුරෙන් ව්‍යාකරණානුකූලව **නිවැරදි** වාක්‍යය තෝරන්න.

38. (1) දරුවෝ විසින් දෙමව්පියන්ට සැලකිය යුතු ය. (2) ඔවුන් දක්ෂ දරුවෝ වෙති.
    (3) අපි දක්ෂ ක්‍රීඩකයෝ වෙමු. (4) අභ්‍යාසලාභීන් බඳවා ගනු ලැබේ.

39. (1) මම ඉහළින් ම විභාගයෙන් සමත් වුවහොත් දෙමාපියෝ සතුටු වෙති.
    (2) වෛද්‍යවරිය ද සහායිකාව ද රෝගියාට බෙහෙත් කරන්නී ය.
    (3) මම ඒ කෙටිකතාව කියවා නැත.
    (4) දෙමාපියන් පාසල් සංවර්ධන සමිති රැස්වීමට සහභාගි වී ඇත.

40. (1) දේවිකා දක්ෂ ගායිකාවක මෙන් ගී ගයා රසික පිරිස සතුටු කළා ය.
    (2) අපේ ක්‍රීඩකයෝ තරගයෙන් ජය ගනිව්.
    (3) තාත්තා හෝ අම්මා හෝ විවිධ ප්‍රසංගයට සහභාගි වෙති.
    (4) කම්කරුවන් වැඩ කරද්දී අධීක්ෂකවරුන් ඒ දෙස බලා සිටිති.

## 2.1.3 අපේක්ෂිත පිළිතුරු හා ලකුණු දීමේ පටිපාටිය

**ලකුණු දීමේ පටිපාටිය - I පත්‍රය**

| ප්‍රශ්න අංකය | පිළිතුර | ප්‍රශ්න අංකය | පිළිතුර |
|---|---|---|---|
| 01. | 4 | 21. | 4 |
| 02. | 4 | 22. | 3 |
| 03. | 3 | 23. | 4 |
| 04. | 1 | 24. | 1 |
| 05. | 2 | 25. | 2 |
| 06. | 3 | 26. | 1 |
| 07. | 1 | 27. | 1 |
| 08. | 4 | 28. | 2 |
| 09. | 2 | 29. | 3 |
| 10. | 1 | 30. | 3 |
| 11. | 2 | 31. | 1 |
| 12. | 4 | 32. | 4 |
| 13. | 3 | 33. | 1 |
| 14. | 1 | 34. | 1 |
| 15. | 3 | 35. | 2 |
| 16. | 1 | 36. | 3 |
| 17. | 4 | 37. | 4 |
| 18. | 2 | 38. | 3 |
| 19. | 2 | 39. | 4 |
| 20. | 1 | 40. | 1 |

නිවැරදි එක් පිළිතුරකට ලකුණු 01 බැගින් ලකුණු 40කි.

**2.1.4. I ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයීම පිළිබඳ නිරීක්ෂණ හා නිගමන**

* **I පත්‍රය සඳහා පිළිතුරු සැපයීම පිළිබඳ නිරීක්ෂණ ප්‍රස්තාරය 1 ඇසුරෙන් සකස් කර ඇත.**

* ව්‍යාකරණ ප්‍රශ්නවලට නිවැරදි පිළිතුරු සපයා තිබූ අපේක්ෂකයින්ගෙන් බහුතරය 30%ත් 50%ත් අතර විය. එමනිසා ව්‍යාකරණ පිළිබඳ දැනුම වඩාත් පෘථුල කළ යුතු බව හැඟෙයි. සිසුන් ව්‍යාකරණ අභ්‍යාසවල වඩවඩාත් නිරත කරවිය යුතු අතර පියවරෙන් පියවර ක්‍රමානුකූලව ව්‍යාකරණ දැනුම ලබාදීම අවශ්‍ය ය.

* මෙම ප්‍රශ්න පත්‍රයේ දුෂ්කර ම ප්‍රශ්නය වී තිබුණේ හතරවන ප්‍රශ්නයයි. සාර්ථක ලෙස පිළිතුරු සපයා තිබුණේ 8%ක ප්‍රමාණයකි. මෙයින් පැහැදිලි වන්නේ අවස්ථාවෝචිතව යෝග්‍ය පරිදි භාෂාව හසුරුවා ගැනීමේ කුසලතාව අවම මට්ටමක පැවති බවයි. අංක 28 ප්‍රශ්නය සඳහා නිවැරදි පිළිතුරු සපයා තිබූ සංඛ්‍යාව 22%ක් පමණ වේ. ඒ අනුව සිංහල භාෂාවේ සංක්ෂිප්ත ව්‍යවහාර පිළිබඳ ව සිසුන් තුළ සාර්ථක මට්ටමක අවබෝධයක් නොපැවති බව පැහැදිලි වේ. අංක 29 ප්‍රශ්නය සඳහා නිවැරදි පිළිතුරු සපයා තිබූ සංඛ්‍යාව 22%ක් පමණ වේ. ඒ අනුව සිසුන් තුළ භාෂා අවබෝධය ද සාර්ථක මට්ටමක නොවූ බව පැහැදිලි වේ.

* සිසුන් තුළ භාෂා කුසලතා හා භාෂා දැනුම වර්ධනය කිරීම අවශ්‍ය වන අතර ඒ සඳහා නිරන්තරයෙන් ම සුදුසු අභ්‍යාසවල යෙදවිය යුතුය.

## 2.2 II ප්‍රශ්න පත්‍රය හා පිළිතුරු සැපයීම පිළිබඳ තොරතුරු

### 2.2.1. II ප්‍රශ්න පත්‍රයේ ව්‍යුහය

**කාලය : පැය 02 යි.**

ප්‍රශ්න සියල්ල සඳහා පිළිතුරු සැපයිය යුතුව තිබිණි. ප්‍රශ්න පත්‍රයට හිමි ලකුණු ප්‍රමාණය වූයේ 80කි. පළමු වන ප්‍රශ්නය භාෂා පරිචය ඇගයීම සඳහා ද දෙවැනි ප්‍රශ්නය සංශ්ලේෂණ හැකියාව මැන බැලීම සඳහා ද තුන්වන ප්‍රශ්නය සංශ්ලේෂණ හා විශ්ලේෂණ හැකියාව මැන බැලීම සඳහා ද යොදා ගෙන තිබිණි. හතරවන ප්‍රශ්නය අවබෝධය මැනීමක් විය. පස්වන ප්‍රශ්නය සඳහා අත්පත්‍රිකාවක් හෝ පුවත්පත් දැන්වීමක් හෝ ලිවිය යුතු විය. එය ප්‍රායෝගික හැකියා පිළිබඳ කුසලතා ඇගයීමක් විය.

**2.2.2 II ප්‍රශ්න පත්‍රය සඳහා අපේක්ෂිත පිළිතුරු, ලකුණු දීමේ පටිපාටිය, පිළිතුරු සැපයීම පිළිබඳ නිරීක්ෂණ හා නිගමන**

**II පත්‍රය සඳහා පිළිතුරු සැපයීම පිළිබඳ නිරීක්ෂණ ප්‍රස්තාර 2, 3, 4.1, 4.2 හා 4.3 ඇසුරෙන් සකස් කර ඇත.**

**ලකුණු දීමේ පටිපාටිය**

ප්‍රශ්න අංකය - 01 - මුළු ලකුණු 20යි.
අපේක්ෂණය - භාෂා පරිචය මැනීම

ව්‍යුහය

මෙම ප්‍රශ්නයට කෙටි පිළිතුරු අපේක්ෂිත අනුප්‍රශ්න දහයක් ඇතුළත් වේ.
අනුප්‍රශ්නයකට ලකුණු 02 බැගින් ලකුණු 20කි.

**1.** (i) සිට (x) තෙක් ඇති සියලු ම අනුකොටස්වලට කෙටි උත්තර ලියන්න. කිසියම් අනුකොටසකට උත්තර නොලියන්නේ නම් එහි අංකය ලියා ඉදිරියෙන් ඉරක් අඳින්න.

(i) සිංහල අක්ෂර මාලාවෙහි ඇතුළත් වන පහත සඳහන් අක්ෂර කාණ්ඩ **දෙක** නම් කරන්න.
(අ) ෂ, ශ, ස, හ, ෆ (ආ) ය, ර, ල, ව

(ii) මෙහි (අ), (ආ) කොටස්වල එන වාක්‍ය දෙකෙහි **තද කළු අකුරෙන්** දැක්වෙන පද නිදෙස් කොට එම පදය පමණක් නැවත ලියන්න.
(අ) අලුත් සහල් මංගල්‍යය අපේ **සම්ප්‍රදයික** උත්සවයකි.
(ආ) **කාර්තාලීය** කටයුතු නිසි පරිදි සිදුකිරීම රටේ දියුණුවට හේතු වේ.

(iii) පහත සඳහන් එක් එක් වාක්‍ය ඛණ්ඩය සඳහා අර්ථවත් **තනි පදය** බැගින් ලියන්න.
(අ) කිසියම් ව්‍යාපාරයක් සඳහා මුදල් යෙදවීම (ආ) වචනවල සැඟවී ඇති තේරුම

(iv) මෙහි (අ), (ආ) වාක්‍යවල යෙදී ඇති කලාපය යන වචනයට තේරුම් දෙකක් ඇත. ඒ තේරුම් **දෙක** වෙන් වෙන් ව ලියන්න.
(අ) සහරාවේ දෙවන **කලාපය** දැන් තිකුත් වී ඇත.
(ආ) දකුණු ආසියානු **කලාපය** දියුණුවෙමින් පවතී.

(v) පහත දැක්වෙන (අ), (ආ) යෙදුම්වල පළමුවැනි පදය සමග දෙවැනි පදයෙහි නොගැළපීමක් ඇත. වඩාත් ගැළපෙන සේ පළමුවැනි පදය සකස්කර ලියන්න.
(අ) කනිටු පාඨශාලාව (ආ) සතුන් සංහතිය

(vi) පහත දැක්වෙන කර්තෘකාරක වාක්‍ය දෙක කර්ම කාරක වාක්‍ය බවට හරවා ලියන්න.
(අ) ගුරුවරු විනය ගරුක ශිෂ්‍යයන් අගය කරති.
(ආ) ගොවියා වගා හානි කරන කීඩෑවන් මර්දනය කළේ ය.

(vii) පහත දී ඇති කවිපේළි දෙකෙහි **තද කළු අකුරෙන්** දැක්වෙන පද වර්ගය නම් කරන්න.
(අ) 'රෑ පානේ ඉරිදා පොළට **ඇදුණු** බරබාගෙක' (ආ) 'බැඳි දද **එවී** අරුණලු නැගි පෙරඹරට'

(viii) පහත (අ), (ආ) කොටස්වල දැක්වෙන පදවලට විරුද්ධාර්ථවත් තනි පදයක් ලියන්න.
(අ) වෛකල්පික (ආ) සංශ්ලේෂණය

(ix) වාරි කර්මාන්තය හා බැඳී ඇති පහත සඳහන් පදවල අදහස ලියන්න.
(අ) තාවුල්ල (ආ) බිසෝකොටුව

(x) 'කල්කිරියාව හොඳයි' යන යෙදුමෙන් යමකුගේ යහපත් හැසිරීම අදහස් වේ. ඒ අනුව පහත සඳහන් යෙදුම්වල අදහස ලියන්න.
(අ) කල්යල් බැලීම (ආ) කල් මැරීම *(ලකුණු 20 යි.)*

## අපේක්ෂිත පිළිතුර

i (අ) ඌෂ්මාක්ෂර/සර්ෂ/ඌෂ්ම (එක් අකුරක් හෝ වැරදි නම් ලකුණු නැත.)
(ආ) අර්ධ ස්වර/අන්තඃස්ථ/අන්තඃස්ථාක්ෂර

ii (අ) සාම්ප්‍රදායික
(ආ) කාර්යාලයීය/කායර්ාලයීය/කාර්‍යාලයීය
(නිවැරදි වචනය සමග වාක්‍යය ම ලියා තිබුණත් ලකුණු දෙන්න.)

iii (අ) ආයෝජනය
(ආ) ව්‍යංග්‍යාර්ථය/ධ්වනිතාර්ථය/ලක්ෂ්‍යාර්ථය

iv (අ) කාණ්ඩය/වෙළුම/කලඹ/කලබ/අංකය
(ආ) ප්‍රදේශය/පෙදෙස

v (අ) කනිෂ්ඨ පාඨශාලාව
(ආ) සත්ත්ව සංහතිය/සත්ව සංහතිය/සත්‍ව සංහතිය

vi (අ) ගුරුවරුන් විසින් විනය ගරුක ශිෂ්‍යයෝ අගය කරනු ලබති/අගය කෙරෙති/අගය කෙරෙත්/අගය කරනු ලබත්/අගය කරනු ලැබෙත්/අගය කරනු ලැබෙති/ඇගයෙති

(ආ) ගොවියා විසින් වගා හානි කරන කීඩෑවෝ මර්දනය කරන ලදහ/කරනු ලැබූහ/කරනු ලැබුවෝය/කරන ලද්දාහ/කරන ලද්දෝය/කෙරුණු/කෙරුණහ/කරන ලදු.

vii (අ) කෘදන්ත/ක්‍රියානාම/ප්‍රත්‍යාර්ථ නාම/කිතක/අතීත කෘදන්ත

(ආ) නිපාත/අව්‍යය/අව්‍යය පද

viii (අ) අනිවාර්ය

(ආ) විශ්ලේෂණය

ix (අ) වැව් ඉස්මත්ත/වැවේ ඉහළ කොටස/වැවේ ඉහළ ප්‍රදේශය/වැව් ඉහත්තාව

(ආ) දිය පාලක මැදිරිය/සොරොව්වට එන ජලය පාලනය කරන ස්ථානය

x (අ) සුදුසු/යෝග්‍ය/උචිත/ගැළපෙන කාලය (අවස්ථාව) බැලීම/බලා සිටීම

(ආ) කාලය ගෙවමින් සිටීම/නිකරුණේ කාලය කාදැමීම/කාලය නාස්ති කිරීම/නිකරුණේ කාලය ගත කිරීම

**පිළිතුරු සැපයීම පිළිබඳ නිරීක්ෂණ හා නිගමන**

මෙම ප්‍රශ්නයට පිළිතුරු සපයා ඇත්තේ අපේක්ෂකයින්ගෙන් 99%ක් පමණි. මෙම ප්‍රශ්නයට හිමි මුළු ලකුණු 20කි. ඉන් ලකුණු 0 - 5ත් (0 - 25%) අතර 49%ක් ද
ලකුණු 6 - 10ත් (26 - 50%) අතර 35%ක් ද
ලකුණු 11 - 15ත් (51 - 75%) අතර 15%ක් ද
ලකුණු 16 - 20ත් (76 - 100%) අතර 01%ක් ද වශයෙන් ලකුණු ලබා ගෙන තිබිණි.

පළමු ප්‍රශ්නයේ අනුකොටස (i) ට පිළිතුරු සැපයීමේ දී (අ) කොටසට 60%ක් ද (ආ) කොටසට 32% ක් ද සාර්ථකව පිළිතුරු සපයා තිබුණි. ඒ අනුව අක්ෂරමාලාව පිළිබඳ ව අපේක්ෂකයන් සතු දැනුම මඳ බව පෙනුණි.

අනුකොටස (ii) ට පිළිතුරු සැපයීමේ දී සාර්ථකව පිළිතුරු සපයා තිබුණේ 40%ක් ප්‍රමාණයකි. ඒ අනුව පැහැදිලි වන්නේ අක්ෂර වින්‍යාසය පිළිබඳ දැනුම සාර්ථක මට්ටමක නොතිබුණු බවයි.

අනුකොටස් (iii) (ආ) කොටස හා (iv) (අ) කොටසට පිළිතුරු සැපයීමේ දී පිළිවෙළින් 26%ක් සහ 16%ක් පමණ ප්‍රමාණයක් සාර්ථක පිළිතුරු සපයා තිබුණු අතර ඒ අනුව භාෂා යෙදුම් පිළිබඳ අවබෝධය මඳ බව දක්නට ලැබිණි.

අනුකොටස (v) (අ) සහ (ආ) කොටස්වලට 38%ක් සහ 42% වශයෙන් සාර්ථක පිළිතුරු සපයා තිබුණු බව පෙනෙන අතර ඒ අනුව භාෂා භාවිතයේ දී තත්සම/තත්භව පද නිවැරදි ව යෙදීම පිළිබඳ ව නිසි අවබෝධයක් නොමැති බව හඳුනා ගත හැකි විය.

අනුකොටස (vi)ට 30%ට අඩු ප්‍රමාණයක් සාර්ථක පිළිතුරු සපයා තිබුණු අතර ඒ අනුව කර්මකාරක හා කර්තෘකාරක වාක්‍ය පිළිබඳ ව අපේක්ෂකයින් සතු දැනුම පහළ මට්ටමක තිබුණු බව පැහැදිලි වේ.

(vii) ප්‍රශ්නයට 20%කට අඩුවෙන් ද, (viii) ප්‍රශ්නයේ (අ) කොටසට 7%ක් පමණ ද, (ix) ප්‍රශ්නයේ (අ), (ආ) කොටස්වලට 22%කට අඩුවෙන් ද (x) ප්‍රශ්නයේ (අ) කොටසට 40%ක් පමණ ද සාර්ථක ව පිළිතුරු සපයා තිබුණු නමුත් එම අනුකොටස්වලට පිළිතුරු සැපයීමේ දී භාෂා භාවිතය පිළිබඳ ව අපේක්ෂකයින් සතු දැනුම සතුටුදායක මට්ටමක නොපැවති බව පෙනුණි.

භාෂාව නිවැරදි ව භාවිත කිරීම පිළිබඳ ව සිසුන්ගේ කුසලතා වර්ධනය සඳහා නිරන්තරයෙන් ම අභ්‍යාසවල යෙදවීම අවශ්‍ය ය. පොතපත කියවීමේ නැඹුරුතාවක් ඇති කිරීම අවශ්‍ය ය.

ලකුණු දීමේ පටිපාටිය

ප්‍රශ්න අංකය - 02 - මුළු ලකුණු 25යි.
අපේක්ෂණය - සංශ්ලේෂණ හැකියාව මැනීම.

ව්‍යුහය

මේ ප්‍රශ්නය සැකසීමේ දී අනුගමනය කර ඇත්තේ මාර්ගෝපදේශිත රචනා මූලධර්මයයි. එනම් පරීක්ෂකයාට ඉදිරිපත් කොට ඇති මග පෙන්වීම ප්‍රයෝජනයට ගනිමින් කිසියම් රචනාවක් කිරීමට අපේක්ෂකයාට ඉඩ සැලැස්වීම යි. රචනයේ ඇතුළත් විය යුතු කරුණු, විස්තරය ඇසුරින් වටහා ගත යුතුය. රචනයෙහි විය යුතු ඡේද සංඛ්‍යාව ගැන වැටහීමක් දී ඇති විස්තරයෙන් ලබාගත හැකිය. මාතෘකාවක් ඉදිරිපත් කොට නැතත්, ඉදිරිපත් කොට ඇති විස්තර ඇසුරින් මාතෘකාව සකස් කර ගැනීමට අපේක්ෂකයාට අවසර ඇත.

02 ප්‍රශ්නය

පහත දැක්වෙන (i), (ii), (iii), (iv) යන විස්තර අතුරෙන් **එකක්** තෝරාගෙන, **වචන 250 ක පමණ** රචනයක් ලියන්න. එක් එක් විස්තරයට මුලින් වරහන් තුළ ඇති රෝම ඉලක්කම ප්‍රශ්න අංකය සමග ඔබේ උත්තර පත්‍රයේ ලියා රචනය ලිවීම ආරම්භ කරන්න. රචනය සඳහා සුදුසු මාතෘකාවක් ද යොදන්න.

- ❊ අන්තර්ගත විය යුතු කරුණු
- ❊ ඡේද සංඛ්‍යාව
- ❊ කරුණු පෙළ ගැස්වීමේ දී අනුගමනය කළ හැකි ක්‍රියා පිළිවෙළ
- ❊ යොදා ගත හැකි මාතෘකාව

ආදිය පිළිබඳ මඟ පෙන්වීමක් අදළ විස්තරය ඇසුරෙන් ලබාගන්න.

**(i)** ගැමි පරිසරය සමග බැඳුණු සිංහල සංස්කෘතිය හා සාරධර්ම ශ්‍රී ලාංකේය අනන්‍යතාව කදිමට කියාපායි. සංවර්ධන ඉලක්ක කරා යාමේ දී සිදු වන නාගරීකරණය නිසා මෙම උසස් ගුණාංග ක්‍රමයෙන් අභාවයට යමින් පවතී. මේවා ආරක්ෂා කර ගැනීමට පෙළ ගැසීම අප කාගේත් වගකීමකි.

**(ii)** ජංගම දූරකථන භාවිතය මේ වනවිට බෙහෙවින් ව්‍යාප්ත වී ඇත. ගෝලීකරණයත් සමග ඇති වී තිබෙන නව විපර්යාස හමුවේ සන්නිවේදන කාර්යය පහසු කිරීමේ ලා මෙවැනි නව තාක්ෂණික මෙවලම් මහෝපකාරී වේ. එහෙත් ඒවා අනිසි ලෙස ප්‍රයෝජනට ගන්නා අහිතකර අවස්ථා ගැන ද නිතර අසන්න ලැබේ.

**(iii)** ළමයින් උදෙසා ද චිත්‍රපට නිෂ්පාදනය කිරීමට ලොව දියුණු රටවල් පෙලඹී ඇත්තේ ළමා ආකල්ප සංවර්ධනය රටක ඉදිරි පැවැත්මට අත්‍යවශ්‍ය ම අංගයක් ලෙස සැලකීමෙනි. එහෙත් ශ්‍රී ලංකාව තවමත් ඒ පිළිබඳ ව වැඩි අවධානයක් යොමුකර ඇති බවක් නොපෙනේ. රටක ජීවනාලිය බඳු ළමා පරපුර වෙනුවෙන් චිත්‍රපට නිෂ්පාදනයට යොමුවීම වර්තමාන යුගයේ අවශ්‍යතාවකි.

**(iv)** රටවැසියන්ගේ සෞඛ්‍ය තත්ත්වය නගා සිටුවීම සඳහා රෝගවලට ප්‍රතිකාර කිරීම වෙනුවෙන් විශාල පිරිවැයක් දැරීමට සෑම රටකට ම සිදු වේ. රෝග සඳහා පිළියම් යොදන අතර ම රෝගවලින් ආරක්ෂා වීමේ අවශ්‍යතාව පිළිබඳ ව ද සියලුදෙනා ම අවධානය යොමු කළ යුතු ය. සෞඛ්‍යසම්පන්න පුරවැසියන් වෙසෙන රටක රෝග ප්‍රතිකාරය මෙන් ම නිවාරණය ද එක සේ වැදගත් වේ. *(ලකුණු 25 යි.)*

අපේක්ෂිත පිළිතුරු හා ලකුණු දීමේ පටිපාටිය

එක් එක් විස්තරයට අදාළ වන්නේ පහත සඳහන් මුඛ්‍ය අදහස් ය.

(i) සංස්කෘතිය හා සාරධර්ම රැකගනිමු
(ii) ගෝලීයකරණය හා සන්නිවේදනය
(iii) ආකල්ප සංවර්ධනයට ළමා චිත්‍රපටවල දායකත්වය
(iv) සෞඛ්‍ය සම්පන්න පරපුරක් උදෙසා රෝග නිවාරණයේ වැදගත්කම

ලකුණු විග්‍රහය - මුළු ලකුණු 25 යි.

| | | |
|---|---|---|
| 1. | සාරවත්භාවය, මාතෘකාව ද ඇතුළු ව | ලකුණු 08යි |
| 2. | සංවිධානය, නිර්මාණාත්මකභාවය හා ස්වීයත්වය | ලකුණු 12යි |
| 3. | ශිල්පීය දක්ෂතා සහ ඡේද බෙදා ලිවීම | ලකුණු 05යි |

01. සාරවත්භාවය ලකුණු 07යි
විස්තරයට අදාළ වන පරිදි මාතෘකාවක් යොදා තිබීම ලකුණු 01යි

තේමාවට අදාළ බව, ඉදිරිපත් කොට ඇති ව්‍යුහයට සමීප බව, සරු බව හා සම බව, වචන ගණන 250 සමීපව පැවතීම යන කරුණු සාරවත්භාවය යටතේ සැලකිල්ලට ගත යුතු වේ.

02. සංවිධානය, නිර්මාණාත්මකභාවය හා ස්වීයත්වය ලකුණු 12යි

මෙහි දී උසස් ප්‍රකාශන ශක්තිය, සංවිධානය, ස්වීයත්වය, නිර්මාණාත්මක ප්‍රකාශන, ව්‍යක්ත ලේඛන ව්‍යවහාරය ආදී අංශ ගැන සලකා බැලිය යුතු ය.

03. ශිල්පීය දක්ෂතා සහ ඡේද බෙදා ලිවීම. ලකුණු 05යි

වියරණ, අත් අකුරු, විරාම ලක්ෂණ භාවිතය, ඡේද අදාළ පරිදි වෙන් කොට තිබීම පද වෙන් කොට ලිවීම යන අංශ ගැන සලකා බලා ලකුණු තීරණය කළ යුතු වේ.

**සැලකිය යුතුයි**

01. රචනයේ වචන ගණන දළ වශයෙන් 200ට වඩා අඩු වන කල්හි ඉහත දැක් වූ 1, 2, 3 යන කොටස්වලට අනුපාතික ව ලකුණක් තීරණය කළ යුතුවේ.

02. වැදගත් අදහස්, සිත් ගන්නා ප්‍රකාශන ඇති තැන්වල (√) යොදන්න. වැරදි තැන්වල (x) ලකුණු යොදන්න.

03. උක්තාඛ්‍යාත සම්බන්ධ වැරදි තැන් යටින් පැහැදිලි ලෙස ඉරක් අඳින්න. අක්ෂර වින්‍යාසය වැරදි වචන වටා රවුමක් අඳින්න.

1, 2, 3 යන කොටස් සඳහා දෙන ලද ලකුණු උත්තර අග හරස් අතට ලියා එකතු කර, මුළු ලකුණු ගණන ලබාගන්න.

| | | | | | |
|---|---|---|---|---|---|
| නිදසුන් | - | 6 | 9 | 3 | 18 |
| | | -- | -- | -- | -- |
| | | 8 | 12 | 5 | 25 |

සංලක්ෂ්‍යය : වාක්‍ය රචනය ඇගයීමට පෙර අදාළ ව්‍යුහය කියවා දළ සැලැස්මක් සකස් කරගන්න. ව්‍යුහයට කිසිසේත් අදාළ නොවන සේ ලියා ඇති රචනා ඇගයීමේ දී සාරවත්භාවය සඳහා පිරිනැමිය යුත්තේ ඉතා අඩු ලකුණකි.

**පිළිතුරු සැපයීම පිළිබඳ නිරීක්ෂණ හා නිගමන**

මෙම ප්‍රශ්නයට පිළිතුරු සපයා ඇත්තේ අපේක්ෂකයින්ගෙන් 98%ක් පමණි. ප්‍රශ්නයට හිමි මුළු ලකුණු 25කි. ඉන් ලකුණු 0 - 6ත් (0 - 25%) අතර 10%ක් ද
ලකුණු 7 - 12ත් (26 - 50%) අතර 24%ක් ද
ලකුණු 13 - 18ත් (51 - 75%) අතර 46%ක් ද
ලකුණු 19 - 25ත් (76 - 100%) අතර 20%ක් ද වශයෙන් ලකුණු ලබා තිබිණි.

සමස්තයක් වශයෙන් ගත් කල රචනා ප්‍රශ්නයට ලකුණු ලබා ගැනීම සතුටුදායක මට්ටමක පැවතිණි. (i), (ii), (iii), (iv) යන මාතෘකා යටතේ පිළිතුරු සැපයූ අපේක්ෂකයන් 52%ත්, 62%ත් අතර ලකුණු මට්ටමක සිටි බව ප්‍රස්තාරය 4 අනුව පැහැදිලි වේ.

නමුත් මෙම මට්ටම තවදුරටත් වර්ධනය කර ගැනීම සඳහා අපේක්ෂකයින්ගේ අදහස් අර්ථවත් ව හා තර්කානුකූලව ඉදිරිපත් කිරීමට අවශ්‍ය ශක්‍යතාව, සන්නිවේදන නිපුණතා මගින් වර්ධනය කළ යුතු වේ. ක්‍රමානුකූලව අදහස් ගැළපීමට හා ශිල්පීය දක්ෂතා වර්ධනය කිරීමට පොත පත පරිශීලනය ඉවහල් වේ.

03 ප්‍රශ්නය

අපේක්ෂණය - කිසියම් කොටසක් කියවා, විස්තර වර්ණනා බැහැර කරමින්, එහි හරය වටහා ගෙන, ඒවා ඇසුරින් සමස්ත අර්ථය තම වචනයෙන් ඉදිරිපත් කිරීමේ හැකියාව මෙහිදී ඇගයේ. එසේ ම සංශ්ලේෂණ මෙන් ම විශ්ලේෂණ හැකියාව ද ඇගයීමට භාජනය කෙරේ.

03 ප්‍රශ්නය

**3.** **පහත දක්වෙන පාඨය වචන 50-55 අතර වන සේ සාරාංශ කොට ලියන්න. ඔබේ සාරාංශයේ ඇතුළත් වචන ගණන උත්තරය අග ලියන්න.**

**රටක් සංවර්ධනය වීමේ දී මිනිසුන්ට ලැබෙන ආදායම ශීඝ්‍රයෙන් ඉහළ යයි. එක් අතකින් පුද්ගලයන් වෙනුවෙන් දැරිය යුතු සාමාජීය වියදම වැඩි වේ. ලංකාව වැනි රටවල ජනගහන වර්ධන වේගය ඉහළ නිසා සුභ සාධන, වියදම් ක්‍රමයෙන් වැඩි වෙයි. අනික් අතින් කර්මාන්ත සහ වෙනත් ව්‍යාපෘති වෙනුවෙන් වූ ප්‍රාග්ධන අවශ්‍යතා පිරිමැසීමේ දී ප්‍රාග්ධන වියදම් ඉහළ යයි. යම් කිසි ආයෝජනයක් හෝ ව්‍යාපෘතියක් ආරම්භ කිරීමත් සමග ම වැටුප්, බදුකුලී, පොලී හා ලාභ යනාදි සාධක, ගෙවීම් ස්වරූපයෙන් මිනිසුන් අතට ආදායම ගලා යයි. එහෙත් එම ආයෝජනවල ප්‍රතිලාභ නැතහොත් ඵලදාව ලැබෙන්නේ කාලයක් ගත වූ පසුව යි. ආයෝජන කාලය හා ප්‍රතිලාභ ලැබෙන කාලය අතර පරතරයක් ඇත. මේ නිසා දියුණු වන රටවල නිතර ම මුදල් සැපයුම භාණ්ඩ සැපයුමට වඩා වැඩි ය. මුදල් සැපයුමට සමානුපාතික භාණ්ඩ සැපයුමක් ඇති කිරීම මගින් උද්ධමනය වළක්වා ගත හැකි නමුත් දියුණු වන රටවලට එය කළ නොහැකි ය. සංවර්ධන ව්‍යාපෘති දිගින් දිගට ම පවත්වා ගෙන යන හෙයින් ඉහත කී පරතරය ද අඛණ්ඩව පවතී. දියුණු වන රටවල උද්ධමනය නොවැළැක්විය හැකි දෙයකි.** *(ලකුණු 10 යි.)*

අපේක්ෂිත පිළිතුරු හා ලකුණු දීමේ පටිපාටිය

ලකුණු විග්‍රහය - මුළු ලකුණු 10 යි

| | | |
|---|---|---|
| අන්තර්ගතය | : | ප්‍රධාන අදහස් සඳහා ලකුණු 06 යි. |
| වචන ගණන | : | ලකුණු 02 යි (වචන 50 - 55 අතර තිබීම සැහේ) |
| ශිල්පීය දක්ෂතා | : | ලකුණු 02 යි (වියරණ, අත් අකුරු, විරාම ලක්ෂණ ආදිය) |

අපේක්ෂිත ප්‍රධාන අදහස්

- ★ රටක සංවර්ධනයේ දී ආයෝජන නිසා ඒක පුද්ගල ආදායම ඉහළ යයි.
- ★ ජනගහන වර්ධන වේගය අනුව සමාජ පිරිවැය වැඩි වෙයි.
- ★ කර්මාන්ත සහ ව්‍යාපෘති හේතුවෙන් ප්‍රාග්ධන වියදම් ඉහළ යයි.
- ★ ආයෝජනවලින් ප්‍රතිලාභ ලැබුණත් ඒ සඳහා කාලයක් ගත වෙයි.
- ★ සංවර්ධනය වන රටවල මුදල් සැපයුම භාණ්ඩ සැපයුමට වඩා වැඩි වීමෙන් උද්ධමනය ඇති වෙයි.
- ★ සංවර්ධන ව්‍යාපෘති අඛණ්ඩව පැවතීම නිසා උද්ධමනය වැළැක්විය නොහැකිය.

වචන ගණන 60 ඉක්මවන කල්හි සැලකිය යුත්තේ මුල් වචන 55 තුළ ඇති ප්‍රධාන අදහස් පමණි. වචන ගණන 45ට අඩුවන කල්හි එහි ඇතුළත් අදහස් ගණනය කොට ඊට සුදුසු අනුපාතික ලකුණක් දෙන්න. උත්තරය ඡේදයක් සේ ලියා තිබිය යුතුවිය. කොටුවක් තුළ පද බෙදා තිබුණ ද පිළිගන්න. එක යට එක අසම්බන්ධිත වාක්‍ය වශයෙන් ලියා ඇත්නම් අන්තර්ගතයට දිය හැකි උපරිම ලකුණු ගණන 02කි. වචන ගණනයේ දී ලිහිල් පිළිවෙතක් අනුගමනය කරන්න. වචන ගණන දළ වශයෙන් 60ට වැඩිවන කල්හි හෝ 45 ට අඩුවන කල්හි වචන ගණන සඳහා 01 (එක) ලකුණක් පිරිනමන්න.

**පිළිතුරු සැපයීම පිළිබඳ නිරීක්ෂණ හා නිගමන**

මෙය අනිවාර්ය ප්‍රශ්නයක් වුව ද පිළිතුරු සපයා ඇත්තේ අපේක්ෂකයන්ගෙන් 97%ක් පමණි. ප්‍රශ්නයට හිමි ලකුණු 10කි. ඉන්

| | | |
|---|---|---|
| ලකුණු 0 - 2ත් (0 - 25%) අතර | 5%ක් ද | |
| ලකුණු 3 - 5ත් (26 - 50%) අතර | 20% ක් ද | |
| ලකුණු 6 - 7ත් (51 - 75%) අතර | 40% ක් ද | |
| ලකුණු 8 - 10ත් (76 - 100%) අතර | 35% ක් ද | වශයෙන් ලකුණු ලබා |

තිබිණි.

සාරාංශ ලිවීමේ ප්‍රශ්නයට ලකුණු ලබා ගැනීම සතුටුදායක මට්ටමක පැවතුණි. සාර්ථකව පිළිතුරු සපයා තිබූ ප්‍රමාණය 66%ක් පමණ විය.
අනවශ්‍ය විස්තර වර්ණනා බැහැර කර මූලික හරය පමණක් හකුළුවා ලිවීමේ හැකියාව වර්ධනය කිරීම පිණිස සරල ඡේද සාරාංශ කිරීම සඳහා සිසුන් පෙලඹවීම ආරම්භක පියවරයක් සේ මෙහි දී නිර්දේශ කළ හැකිය.

04 ප්‍රශ්නය

අපේක්ෂණය - ඉදිරිපත් කොට ඇති ඡේදය ඇසුරින් අවබෝධ හැකියාව මැනීම.

**4.** **පහත දක්වෙන කොටස කියවා, එයින් අසා ඇති ප්‍රශ්නවලට කෙටි උත්තර සපයන්න.**

**විද්‍යාව මනුෂ්‍ය සංහතියට සාධාරණ වූ දායාදයක් වන අතර ජාතික දායාදය වශයෙන් සැලකිය යුත්තේ භාෂාව, සාහිත්‍යය හා ශිල්පයත්, ඒවා සමග අනිවාර්යයෙන් අත්වැල් බැඳගෙන ඇති චාරිත්‍ර වාරිත්‍රත් ය. විද්‍යා විෂයයෙහි නම් යල් පැනපු මතිමතාන්තර තිබේ. එහි නොඇලී අප ඉදිරියට ගියහොත් එය අපේ ගෞරවයට හේතු වන්නේ ය. ආහාර නිෂ්පාදනය, සෞඛ්‍යය, වාසස්ථාන, යාන වාහන ආදිය සම්බන්ධයෙන් නවීන විද්‍යාවේ පිහිට සොයා අපේ ජනතාව සුඛිත මුදිත කිරීම එක්තරා විදියක ජාති වාත්සල්‍යයකි. එහෙත් ඒ අතර ම, කිසියම් ජාතියක අනන්‍යතාව ද රැක ගත යුතු ය. ආරෝග්‍යශාලා හැම රටකට ම පොදු ය. ජෙට් අහස් යාත්‍රා සැම ජාතියකට ම අයිති ය. මොටෝරිය, ට්‍රැක්ටර්, විදුලිබලය වැනි වෙනත් දේ කාටත් තිබේ. එහෙත් කිසියම් ජාතියක අනන්‍යතාව රැකෙන්නේ ඒ ජාතියේ සංස්කෘතිය නිසා ය. මෙකල නියම ජාතික ලක්ෂණයක් කොට සැලකිය හැක්කේ කලා ශිල්ප ආදිය යි.**

(i) **මේ පාඨයේ මූලික අරමුණ කවරේ ද?**
(ii) **ජාතික දායාදයක් වශයෙන් මෙහි දක්වා ඇත්තේ කුමක් ද?**
(iii) **ජනතාවගේ සුඛිත මුදිත භාවය සඳහා දියුණු කළ යුතු අංශ ලෙස දක්වා ඇති කරුණු මොනවා ද?**
(iv) **ජාතියක අනන්‍යතාව හා සංස්කෘතිය අතර පවතින සම්බන්ධතාව මේ ලේඛකයා දකින්නේ කෙසේ ද?**
(v) **පහත සඳහන් යෙදුම්වල අදහස පැහැදිලි කරන්න.**
**(අ) අත්වැල් බැඳගෙන** **(ආ) යල්පැනපු මතිමතාන්තර** *(ලකුණු 10 යි.)*

අපේක්ෂිත පිළිතුරු හා ලකුණු දීමේ පටිපාටිය

ලකුණු විග්‍රහය - මුළු ලකුණු 10 යි
ප්‍රශ්න අංක (i) සිට (iv) තෙක් ලකුණු 02 බැගිනි.
(v) ප්‍රශ්නය සඳහා කොටසකට ලකුණු 01 බැගින් ලකුණු 02 කි.

අපේක්ෂිත පිළිතුරු

i ජාතියේ අනන්‍යතාව සංස්කෘතියෙන් පිළිඹිබු වන බව/ජාතියේ අනන්‍යතාව හා සංස්කෘතිය අතර සම්බන්ධතාව (සමාන අදහසක් උත්තරය සේ ලියා ඇත්නම් පිළිගන්න.)

ii භාෂාව, සාහිත්‍යය, කලා ශිල්ප හා ඒවා සමඟ බැඳුණු චාරිත්‍ර වාරිත්‍ර

iii ආහාර නිෂ්පාදනය, සෞඛ්‍යය, වාසස්ථාන හා යාන වාහන
(කරුණු 04ට ලකුණු 02, කරුණු 03ට ලකුණු 01, කරුණු 03කට අඩු නම් ලකුණු 0 යි.)

iv අවියෝජනීය සම්බන්ධතාවක්/අනුලෝම සම්බන්ධයක්/වෙන් කළ නොහැකි සම්බන්ධයක්/නොවෙනස් සම්බන්ධයක්/ධන සම්බන්ධතාවක්/සෘජු සම්බන්ධතාවක්
(සමාන අදහසක් උත්තරයක් සේ ලියා ඇත්නම් පිළිගන්න.)

v (අ) එකට එකතු වී/එකමුතු වී/එකට බැඳී පවතින/සමගිව/සාමූහිකව/සහයෝගීව
(ආ) කාලයට නොගැළපෙන අදහස්/කාලයට අදාළ නොවන අදහස්/හණමිටි අදහස්/වෙනස් කළ නොහැකි වැරදි අදහස්

**පිළිතුරු සැපයීම පිළිබඳ නිරීක්ෂණ හා නිගමන**

මෙය අනිවාර්ය ප්‍රශ්නයක් වුව ද පිළිතුරු සපයා තිබුණේ 97%ක් පමණ වූ අපේක්ෂක සංඛ්‍යාවකි. ප්‍රශ්නයට හිමි ලකුණු 10කි. ඉන් ලකුණු 0 - 2ත් (0 - 25%) අතර 18%ක් ද
ලකුණු 3 - 5ත් (26 - 50%) අතර 48% ක් ද
ලකුණු 6 - 7ත් (51 - 75%) අතර 24% ක් ද
ලකුණු 8 - 10ත් (76 - 100%) අතර 10% ක් ද වශයෙන් ලකුණු ලබා තිබිණි.

මෙම ප්‍රශ්නයට පිළිතුරු සැපයීම එතරම් සාර්ථක මට්ටමක නොපැවතුණි. (iv) කොටස සඳහා සාර්ථක පිළිතුරු සැපයූ ප්‍රමාණය 18%ක් පමණ විය. (i) කොටස සඳහා 25%ක් පමණ ද වූ අතර (iii) කොටස සඳහා 73%ක පමණ ප්‍රමාණයක් සාර්ථක ව පිළිතුරු සපයා තිබුණි. සමස්ථයක් වශයෙන් ගත් කළ කියවා අවබෝධ කරගැනීමේ දුර්වලතා පවතින බව පැහැදිලි විය. නිර්දිෂ්ට පෙළපොත් මෙන්ම අනිර්දිෂ්ට ග්‍රන්ථ ද පරිශීලනයට සිසුන් පෙලඹවීම වඩා යෝග්‍ය බව පැහැදිලි විය. එසේම (v) ප්‍රශ්නයේ (ආ) යන අනුකොටසට සාර්ථකව පිළිතුරු නොසැපයීමෙන් පැහැදිලි වන්නේ සාම්ප්‍රදායික භාෂා යෙදුම් පිළිබඳව නිශ්චිත දැනුමක් නැති බවයි. එනිසා සාම්ප්‍රදායික භාෂා යෙදුම් පිළිබඳව ද සිසුන් දැනුවත් කළ යුතුය.

05 ප්‍රශ්නය

ව්‍යුහය

ප්‍රායෝගික ලේඛන හැකියාව පිළිබඳ අපේක්ෂකයා සතු කුසලතා ඇගයීමට ලක්කිරීම සඳහා දී ඇති තොරතුරු ඇසුරින් රාජකාරි ලිපියක් හෝ පුවත්පත් වාර්තාවක් හෝ ලිවීමට දී තිබුණි.

05 ප්‍රශ්නය

**5.** **ශීඝ්‍රයෙන් පැතිර යන ඩෙංගු උණ රෝගයෙන් මහජනතාව බේරා ගැනීම ජාතික අවශ්‍යතාවකි. ඔබ ප්‍රදේශයෙහි ඩෙංගු මර්දන මහජන කමිටුවේ ලේකම්වරයා ඔබ යැයි සිතා, මෙම රෝගය ගැන මහජනතාව දැනුවත් කිරීම පිණිස අත් පත්‍රිකාවක් සකස් කරන්න. රෝගය වැළඳීමේ හේතු හා එය වළක්වා ගැනීමට යෙදිය යුතු උපාය මාර්ග, රෝගයෙන් සිදුවන හානිය, රෝගියකු බේරා ගැනීමට ගත යුතු නිවැරදි ක්‍රියා පිළිවෙළ යන කරුණු ඔබ සකස් කරන අත් පත්‍රිකාවෙහි අඩංගු විය යුතුය. (වචන 100 ක් පමණ සෑහේ.)**

**නැතහොත්**

**ප්‍රධාන පෙළේ ප්‍රකාශන ආයතනයකට කළමනාකරණ සහකාරවරයකු බඳවා ගැනීම සඳහා පුවත්පත් දැන්වීමක් පළකළ යුතුව ඇත. එම ආයතනයේ පිරිස් කළමනාකරු ඔබ යැයි අදහස් කොට, පුවත්පත් දැන්වීමක් සකස් කරන්න. ඔබ සකස් කරන දැන්වීමෙහි ආයතනයේ ලියාපදිංචි නම, බඳවා ගැනීමට නියමිත තනතුර, අධ්‍යාපන සුදුසුකම්, වෘත්තීය හා වෙනත් අදාළ සුදුසුකම්, වයස, වැටුප, ඉල්ලුම් පත්‍රය යැවිය යුතු ක්‍රමය, අවසාන දිනය, පිරිස් කළමනාකරුගේ ලිපිනය යන කරුණු ඇතුළත් විය යුතු ය. (වචන 100 ක් පමණ සෑහේ.)**

අපේක්ෂිත පිළිතුරු හා ලකුණු දීමේ පටිපාටිය

අත් පත්‍රිකාව

ලකුණු විග්‍රහය - මුළු ලකුණු 15යි

| | | |
|---|---|---|
| 1. | ආකෘතිය සඳහා ලකුණු | 04 |
| 2. | අන්තර්ගතය සඳහා ලකුණු | 08 |
| 3. | ශිල්පීය දක්ෂතා සඳහා ලකුණු | 03 |

1. ආකෘතිය (ලකුණු 04 යි)
   - මාතෘකාව — ලකුණු 01 යි
   - දැනුම් දෙන්නාගේ තනතුර — ලකුණු 01 යි
   - ලිපිනය හා දිනය — ලකුණු 01 යි (කරුණු දෙකම අවශ්‍යයි)
   - නිර්මාණාත්මක බව — ලකුණු 01 යි

2. අන්තර්ගතය සඳහා (ලකුණු 08 යි)
   - රෝගය වැළඳීමේ හේතු — ලකුණු 02 යි
   - වළක්වා ගැනීමට යෙදිය යුතු උපාය මාර්ග — ලකුණු 02 යි
   - රෝගයෙන් සිදුවන හානිය — ලකුණු 02 යි
   - රෝගියෙකු බේරා ගැනීමට ගත යුතු නිවැරදි ක්‍රියා පිළිවෙළ — ලකුණු 02 යි

3. ශිල්පීය දක්ෂතා සඳහා (ලකුණු 03 යි)
   - නිවැරදි අක්ෂර වින්‍යාසය, වියරණ, විරාම ලකුණු, පැහැදිලි අකුරු උක්තාඛ්‍යාත සම්බන්ධය, ඡේද වෙන් කිරීම, සමස්තයක් සේ සලකා ලකුණු පිරිනමන්න.
   - අදාළ කරුණු සංවිධානාත්මක හා නිර්මාණාත්මකව ඉදිරිපත් කර තිබිය යුතුයි.
     අදාළ ව තවත් කරුණු ලියා ඇත්නම් ඒවා ද පිළිගන්න.

(ලකුණු 15 යි)

පුවත්පත් දැන්වීම

1. ආකෘතිය ලකුණු 04 යි
2. අන්තර්ගතය ලකුණු 08 යි
3. ශිල්පීය දක්ෂතා ලකුණු 03 යි

1. ආකෘතිය (ලකුණු 04 යි)

- ආකර්ෂණීය ශීර්ෂය ලකුණු 01 යි
- නිර්මාණශීලි බව ලකුණු 01 යි
- දැන්වීම පළ කරන්නාගේ නම, ලිපිනය ලකුණු 01 යි (දෙකම අවශ්‍යයි.)
- දැන්වීම පළ කරන දිනය ලකුණු 01 යි

2. අන්තර්ගතය (ලකුණු 08 යි)

- ආයතනයේ ලියා පදිංචි නම ලකුණු 01 යි
- බඳවා ගැනීමට නියමිත තනතුර ලකුණු 01 යි
- අධ්‍යාපන සුදුසුකම් ලකුණු 01 යි
- වෘත්තීය හා වෙනත් සුදුසුකම් ලකුණු 01 යි
- වයස ලකුණු 01 යි
- අපේක්ෂිත වැටුප ලකුණු 01 යි
- ඉල්ලුම් පත්‍රය එවිය යුතු පිළිවෙළ ලකුණු 01 යි
- ඉල්ලුම්පත් එවිය යුතු අවසාන දිනය ලකුණු 01 යි

* නියමිත වචන සංඛ්‍යාව 50ට අඩුවන කල්හි හෝ ප්‍රමාණවත් කරුණු හෝ අදාළ කරුණු අන්තර්ගත නොවන අඩුපාඩු සහිත උත්තර ඇති කල්හි හෝ වචන 150ට වැඩිවන කල්හි අනුපාතික ලකුණක් දෙන්න.

3. ශිල්පීය දක්ෂතා (ලකුණු 03 යි)

නිවැරදි අක්ෂර වින්‍යාසය, පැහැදිලි අත් අකුරු, නිවැරදි පද බෙදීම, ව්‍යාකරණ, විරාම ලක්ෂණ, ඡේද වෙන් කිරීම සමස්තයක් සේ සලකා ලකුණු පිරිනමන්න.

1, 2, 3 යන අංශ සඳහා ලකුණු වෙන් වෙන් ව දී ලකුණු එකතුව ලබාගන්න. (ලකුණු 15 යි)

**පිළිතුරු සැපයීම පිළිබඳ නිරීක්ෂණ හා නිගමන**

මෙම ප්‍රශ්නය අනිවාර්ය වුවත් පිළිතුරු සපයා ඇත්තේ අපේක්ෂකයින්ගෙන් 94%ක් පමණ ප්‍රමාණයකි. ප්‍රශ්නයට හිමි මුළු ලකුණු 15කි. ඉන්

| | | |
|---|---|---|
| ලකුණු 0 - 3ත් (0 - 25%) අතර | 7%ක් ද |
| ලකුණු 4 - 7ත් (26 - 50%) අතර | 22% ක් ද |
| ලකුණු 8 - 11ත් (51 - 75%) අතර | 46% ක් ද |
| ලකුණු 12 - 15ත් (76 - 100%) අතර | 25% ක් ද |

වශයෙන් ලකුණු ලබා තිබිණි.

මෙම ප්‍රශ්නයෙන් බලාපොරොත්තු වී තිබුණේ ප්‍රායෝගික ලේඛන හැකියාව පිළිබඳ අපේක්ෂකයන් සතු කුසලතා මැනීමයි. එනම් අත් පත්‍රිකාවක් සකස් කිරීම හෝ පුවත්පත් දැන්වීමත් සකස් කිරීම හෝ සම්බන්ධ අවබෝධයයි.

සමස්තයක් වශයෙන් සලකන විට මෙම ප්‍රතිඵල මධ්‍යස්ථ මට්ටමක පැවති බව පැහැදිලි වේ. 62%ක පමණ ප්‍රමාණයක් සාර්ථකව පිළිතුරු සපයා තිබුණි. මෙම තත්ත්වය ප්‍රශස්ත මට්ටමට ගෙන ඒම සඳහා ප්‍රායෝගික ලේඛන පිළිබඳ සතතාභ්‍යාසවල සිසුන් නිරත කළ යුතුය.

## 2.3 III ප්‍රශ්න පත්‍රය හා පිළිතුරු සැපයීම පිළිබඳ තොරතුරු

### 2.3.1. III ප්‍රශ්න පත්‍රයේ ව්‍යුහය

**ව්‍යුහය**

මෙම ප්‍රශ්න පත්‍රයට නියමිත ව තිබූ කාලය පැය දෙකකි.

**ප්‍රශ්න පත්‍රයේ ස්වභාවය**

නිර්දිෂ්ට සාහිත්‍ය පාඨ පිළිබඳ ව අවබෝධය, රසවින්දන හැකියාව ඇගයීමට ලක් කෙරිණි. 1, 2, 3, 4 ප්‍රශ්නවලට පිළිතුරු අනිවාර්ය වී තිබුණු අතර 5, 6, 7 ප්‍රශ්න අතුරෙන් තෝරාගත් එක් ප්‍රශ්නයකට පමණක් පිළිතුරු අපේක්ෂා කෙරිණි.

අංක 3 හා 4 ප්‍රශ්නවල i හා ii වශයෙන් කොටස් දෙක බැගින් තිබිණි.

2.3.2 **III ප්‍රශ්න පත්‍රය සඳහා අපේක්ෂිත පිළිතුරු, ලකුණු දීමේ පටිපාටිය, පිළිතුරු සැපයීම පිළිබඳ නිරීක්ෂණ හා නිගමන**

ප්‍රශ්න අංකය - 01

**අපේක්ෂණය** - නිර්දිෂ්ට ග්‍රන්ථ පරිශීලනය පිළිබඳ පරිචය ඇගයීම

**ලකුණු විග්‍රහය** - මුළු ලකුණු 20 යි.

මෙම ප්‍රශ්නයට කෙටි උත්තර අපේක්ෂිත අනුප්‍රශ්න දහයක් ඇතුළත් වේ. එක් අනුප්‍රශ්නයක එක කොටසකට ලකුණු 01 බැගින් මුළු ලකුණු 20 කි.

**1.** (i) සිට (x) තෙක් ඇති **සියලු ම** අනුකොටස්වලට කෙටි උත්තර ලියන්න. කිසියම් අනුකොටසකට ඔබ උත්තර **නොලියන්නේ** නම් එහි අංකය ලියා ඉදිරියෙන් ඉරක් අඳින්න.

(i) "එසේ වී නම් තෙපි ම ඔහු මා කරා කැඳවාගෙන එව."

(අ) මෙම ප්‍රකාශය කිරීමට හේතු වූ කරුණ කුමක් ද?

(ආ) මෙහි ඔහු යනුවෙන් හඳුන්වා ඇති අයගේ නම ලියන්න.

(ii) "බලන්න මේ මූණ දිහා හරියට පණපිටින් වාගෙ"

(අ) මෙම ප්‍රකාශය හා සබැඳි අවස්ථාව කුමක් ද?

(ආ) මෙම කොටස උපුටාගත් කෙටි කතාවේ කතුවරයා කවරෙක් ද?

(iii) "**දියෙකින් නැගුණු ගින්නක් මෙන්** වියැ මෙදිනේ

ඉතිකින් කෙසේ වැවෙමි දෝ හිමි සඳිනේ"

(අ) මෙම කවියේ මුල් පද **දෙක** සම්පූර්ණ කරන්න.

(ආ) තද කළු අකුරින් මුද්‍රිත කොටසින් ඇඟවෙන සිදුවීම කුමක් ද?

(iv) "මොක ද මේ පැත්තෙ හුඟක් කාලෙකින් නාවේ?"

(අ) මෙය කාගේ ප්‍රකාශයක් ද? (ආ) එය ශ්‍රවණය කළේ කවරකු ද?

(v) "ගැටවටු ගන්වා සිවුරු වැළඳගෙන පාත්‍රය පටවා ගෙන **දකුණු මුහුද ගමන් ගත් නැවක් මෙන්** අහසින් අවුත් බිමට බැස ලා"

(අ) මෙම පාඨය උපුටා ගත් මුල් කෘතිය නම් කරන්න.

(ආ) තද කළු අකුරු සහිත කොටසින් උපමාවට ලක් කර ඇත්තේ කවුරුන් ද?

(vi) "ඇත්තට ම මේ නම් තිත්ත වස කෝප්පයක් නොවේ ද?"

(අ) මෙසේ සිතුවේ කවරකු ද? (ආ) තිත්ත වස කෝප්පයක් ලෙස හඳුන්වන ලද්දේ කුමක් ද?

(vii) (අ) සිවු පද ආරෙන් රචිතව, දනට දක්නට ඇති මුල් ම ජාතක කතා කාව්‍යය කුමක් ද?

(ආ) එම කාව්‍ය ග්‍රන්ථයේ රචකයා කවරකු ද?

(viii) "**සුදු** සක ලෙසට ඇත් පැටියෙක් විත් යහනේ

**සුදු** යම් දෙයක් සිදුවෙයි මම දුටු සීනේ"

එක් එක් කවි පදයේ තද කළු අකුරෙන් මුද්‍රිත වචනවල අදහස් වෙන් වෙන්ව ලියන්න.

(අ) සුදු (ආ) සුදු

(ix) (අ) සද්ධර්මරත්නාවලිය ලියන ලද්දේ කුමන කෘතියක් ඇසුරු කර ගෙන ද?

(ආ) කාබුලිවාලා සහ වෙනත් කතා නමැති පරිවර්තන කෘතිය ලියූ කතුවරයා කවරකු ද?

(x) පහත සඳහන් ග්‍රන්ථ ලියැවුණු සාහිත්‍ය යුග නම් කරන්න.

(අ) පන්සිය පනස් ජාතක කතා පොත (ආ) පූජාවලිය *(ලකුණු 02 × 10 = 20 යි)*

**අපේක්ෂිත පිළිතුරු හා ලකුණු දීමේ පටිපාටිය**

i (අ) බිම්බිසාර රජතුමා භගන්දරාබාදය සුවපත් කර ගැනීමට සිතූ අවස්ථාව
(ආ) ජීවක

ii (අ) පත්මා මිස් සිරියාවතීගේ චිත්‍රය අගය කළ අවස්ථාව
(ආ) මහාචාර්ය ඒ.වී. සුරවීර මහතා

iii (අ) නිදුකින් සමඟ පෙම් බැඳ සැප විඳ සොඳිනේ
බසෙකින් විතර වෙනසක් නොවැ ඉඳින දිනේ
(ආ) කිඳුරා හදිසියේ ගී පහරට ලක්වීම/ඇදහිය නොහැකි විපතක් සිදුවීම වැනි අදහසක්

iv (අ) නන්දාවතීගේ/තෙපානිස්ගේ දියණියගේ
(ආ) ලව්නේරිස්

v (අ) සද්ධර්මරත්නාවලිය
(ආ) පසේ බුදුන් වහන්සේ

vi (අ) කථකයා/බාබු සහීබ්/බාබුජී
(ආ) කථකයා අම්හිරි අත්දැකීමකට/වංචාවකට/රැවටීමකට හසු වී යයි සිතීම

vii (අ) සඳකිඳුරු දා කව
(ආ) විල්ගම්මුල සංඝරාජ හිමි/විල්ගම්මුල හිමි

viii (අ) සුදුපාට/ධවල/කිරිපාට
(ආ) යහපත්/හොඳ/සුබදායක/සුබ

ix (අ) පාලි ධම්මපදට්ඨ කථාව
(ආ) ඩබ්ලිව්.ඒ. අබේසිංහ

x (අ) කුරුණෑගල යුගය
(ආ) දඹදෙණි යුගය

**පිළිතුරු සැපයීම පිළිබඳ නිරීක්ෂණ හා නිගමන**

මෙම ප්‍රශ්නය අනිවාර්ය ප්‍රශ්නයකි. පිළිතුරු සැපයීම 100%කි. ප්‍රශ්නයට හිමි මුළු ලකුණු 20කි. ඉන්

ලකුණු 0 - 5ත් (0 - 25%) අතර 30%ක් ද
ලකුණු 6 - 10ත් (26 - 50%) අතර 34%ක් ද
ලකුණු 11 - 15ත් (51 - 75%) අතර 26%ක් ද
ලකුණු 16 - 20ත් (76 - 100%) අතර 10%ක් ද වශයෙන් ලකුණු ලබා තිබිණි.

මෙම ප්‍රශ්නයෙන් බලාපොරොත්තු වී තිබුණේ නිර්දිෂ්ට සාහිත්‍ය පාඨ පිළිබඳ ව අපේක්ෂකයාගේ පරිචය ඇගයීමයි.

ප්‍රශ්න අංක 1 - (i) අ, ආ අනුකොටස් දෙකට පිළිතුරු සපයා තිබුණේ පිළිවෙළින් 22%ක් හා 42%ක් පමණ ප්‍රමාණයකි. ඒ අනුව සාර්ථක ව පිළිතුරු සපයා නොතිබුණු බව පෙනෙයි. (ii) අනුකොටසට තරමක් සාර්ථකව පිළිතුරු ලියා තිබිණි. (iii), (v), (vi), (ix) යන අනුකොටස්වලට ද සාර්ථකව පිළිතුරු ලියා නොතිබිණි. මෙම අනුකොටස් සඳහා සාර්ථක පිළිතුරු සපයා තිබුණේ 50%කට අඩු ප්‍රමාණයකි. සාර්ථක ව පිළිතුරු ලියූ අනුකොටස් ලෙස (iv) ආ කොටස (vii) (viii) අ කොටස හා (x) යන අනුකොටස් දැක්විය හැකිය. 60%කට වැඩි ප්‍රමාණයක් සාර්ථකව පිළිතුරු සපයා තිබුණි. පැරණි සාහිත්‍යය පිළිබඳ අවබෝධය මඳබව (i), (iii), (v), (ix) යන අනුකොටස්වලට ඉතාම අඩු ප්‍රතිශතයක් පිළිතුරු සැපයීමෙන් පැහැදිලි විය. එබැවින් පුරාතන සාහිත්‍යය පිළිබඳ ව වැඩි දැනුමක් ලබාගැනීම සඳහා සිසුන් පෙලඹවිය යුතු අතර පැරණි සාහිත්‍යය කෙරෙහි ඇල්මක් ඇතිවන අයුරින් ඉගැන්වීම පිළිබඳව ගුරුවරුන්ගේ වැඩි අවධානය යොමු විය යුතුය.

02 වන ප්‍රශ්නය

අපේක්ෂණය 1. නිර්දිෂ්ට පාඨ පිළිබඳ අවබෝධය
2. පාඨයක අදහස තම බසින් ලියා දැක්වීමේ කුසලතාව ඇගයීම

ලකුණු විග්‍රහය - ප්‍රශ්නයකට හිමි මුළු ලකුණු 20 යි.
(එක් කොටසකට ලකුණු 05 බැගින්)

තද කළු අකුරින් ඇති එක් එක් වචනයට නිවැරදිව තේරුම් ලියා ඇත්නම් එක් වචනයකට
ලකුණු 01 බැගින් - ලකුණු 02 යි
සමස්ත අර්ථයට - ලකුණු 03 යි

**2. පහත දක්වෙන ගද්‍ය හා පද්‍ය පාඨවල තද කළු අකුරින් මුද්‍රිත කොටස්වල අර්ථය වෙන් වෙන් ව ලියන්න. ඉන් පසු මුළු කොටසේ ම අර්ථය ලිහිල් බසින් ලියන්න.**

**(i) "එක් වේලෙක අනුභව කළ දෙය එක් වේලෙක නගා පියා ජීවිතය රක්ෂා කෙරෙති. එකල සිටාණෝ ශුෂ්ක කාෂ්ඨයක් සේ වියළී දවසින් දවස පඬුවන් ව ගියහ."**

**(ii) "නිධාන නම් රජ දරුවන් සන්තක බව නොදනු ද? කිමෙක් ද? තෙපි හලාහල විෂටත් වඩා උග්‍ර වූ වර්ගවිනාශයට කාරණා වූ නිධාන තබාගෙන ප්‍රයෝජන විඳු දයි කියා භය ගන්වා බණන්නී."**

**(iii) "අතක් බෝසතුන් ළෙයි තබමින් විමසා**
**මදක් සැලි සැලී පණනල තිබෙන නිසා**
**පසක් තෙදැති දෙවියන් යදිමින් නොලසා**
**නැතක් කන්නලවු බස් තෙපලයි මෙලෙසා"**

**(iv) "සතුටු ව උදන් ගී කිය කියා තමා හා ඒකාත්මක වූ මිත්‍ර පුත්‍රකලත්‍රාදීන් හා පරිවාර ජනයන් පිරිවරා නිත්‍යසන්තෝෂයෙන් පින පිනා නොයෙක් කෙළි නළුයෙහි නියුක්ත ව සැපසේ වසන්නාහු ම ය."** *(ලකුණු 05 × 04 - 20 යි)*

අපේක්ෂිත උත්තරය

i. ශුෂ්ක කාෂ්ඨයක් - වියළි කෝටුවක්/වියළි දණ්ඩක්/වියළි දර ලීයක්/
පඬුවන්ව - සුදුමැලිව/කහ පැහැව/පඬු පැහැය/දුර්වර්ණ

"එක් වේලක් ආහාරයට ගත් දෙය තවත් වේලක ජීවිතය ආරක්ෂා කෙරෙති.
එවිට සිටාණෝ වියළි දරකෝටුවක් මෙන් වියළී දවසින් දවස කහ පැහැ වූහ"

ii. සන්තක - අයත්/සතු/අයිති/හිමි
වර්ග විනාශයට - පරම්පරාවේ විනාශයට/පරපුරේ විනාශයට

"නිධාන රජවරුන්ට අයත් බව නොදන්නේ ද? කුමක් ද? තොප හලාහල නමැති (ඉතා උග්‍ර) විෂටත් වඩා දරුණු වූ තම පරපුරේ විනාශයට හේතු වූ නිධාන තබා ගෙන ප්‍රයෝජන ගන්නේ දැයි කියා භය ගන්වා කියන්නී"

iii. පසක් තෙදැති - ප්‍රත්‍යක්ෂ වූ තේජස ඇති/සත්‍යවශයෙන් ම තේජවන්ත
නැතක් කන්නලවු - බොහෝ ඇවිටිලි/ඉවරයක් නැති ඇවිටිලි/අඳෝනා

"බෝසතුන්ගේ පපුවෙහි අතක් තබමින් විමසා ගැහි ගැහී ප්‍රාණවායුව තිබෙන බව දැන ප්‍රත්‍යක්ෂ වශයෙන් තේජස් ඇති දෙවියන්ට අනලස්ව බොහෝ ඇවිටිලි බස් මේ ආකාරයට පවසයි."

iv. ඒකාත්මික - ආත්මීය වශයෙන් බැඳුණු/එකම ආත්මයක් බවට පත් වූ
මිත්‍රපුත්‍රකලත්‍රාදීන් - මිතුරන් දරුවන් අඹු (භාර්යා) ආදීන්

"සතුටින් ප්‍රීති වාක්‍ය කියමින් තමා සමඟ ආත්මීය වශයෙන් බැඳුණු මිතුරන්, දරුවන් අඹු (භාර්යා) ආදීන් සහ පිරිවර ජනයා හා එක්ව නිරන්තර සතුටින් කුල්මත්ව විවිධ ක්‍රීඩා නාට්‍යයෙහි නියැළී සැපසේ වාසය කරති."

**පිළිතුරු සැපයීම පිළිබඳ නිරීක්ෂණ හා නිගමන**

මෙය අනිවාර්ය ප්‍රශ්නයක් වන අතර අපේක්ෂකයින්ගෙන් 95%ක් පමණ පිළිතුරු සපයා තිබිණි. මෙම ප්‍රශ්නයට හිමි ලකුණු 20කි. ඉන්
ලකුණු 0 - 5ත් (0 - 25%) අතර 46%ක් ද
ලකුණු 6 - 10ත් (26 - 50%) අතර 32%ක් ද
ලකුණු 11 - 15ත් (51 - 75%) අතර 16%ක් ද
ලකුණු 16 - 20ත් (76 - 100%) අතර 6%ක් ද වශයෙන් ලකුණු ලබා තිබිණි.

නිර්දිෂ්ට ග්‍රන්ථ ඇසුරෙන් සැකසුණු මෙම ප්‍රශ්නයට පිළිතුරු සැපයීමේ දී ලකුණු ලබා ගැනීම ප්‍රශස්ත මට්ටමක නොතිබිණි. (i), (iii), (iv) අනුකොටස් සඳහා 32%ට අඩු ප්‍රමාණයක් සාර්ථකව පිළිතුරු ලියා තිබුණු අතර (ii) අනුකොටසට සාර්ථකව පිළිතුරු සපයා තිබුණේ 52%ක ප්‍රමාණයකි. නිර්දිෂ්ට ග්‍රන්ථ පරිශීලනය සඳහා සිසුන් මෙහෙයවීමත්, සාහිත්‍ය ප්‍රශ්නවලට නිවැරදිව පිළිතුරු සැපයීමේ මනා පරිචයක් ලබාදීමත් මෙහි දී වැදගත් ය.

**ප්‍රශ්න අංක** : 03 - 07 තෙක්

**අපේක්ෂණය** - ඇගයීම, ප්‍රකාශනය, භාවිත හැකියාව, විචාර හැකියාව හා රසවින්දන හැකියාව ඇගයීමට ලක් කිරීම.

**ලකුණු විග්‍රහය** - 3, 4 ප්‍රශ්න අනිවාර්යයි ලකුණු 15 යි.
5, 6, 7 ප්‍රශ්නවලින් එකක් පමණක් තෝරා ගත යුතුය. ලකුණු 10 යි.

3, 4 ප්‍රශ්නවල තෝරා ගත් ප්‍රශ්නයේ (i) හා (ii) කොටස් වෙන් වෙන් ව විස්තර සහිතව ලියා තිබිය යුතුය උදාහරණ දක්වමින් එක් පිළිතුරක් සේ ලියා තිබුණ ද ලකුණු දෙන්න.

| | | | |
|---|---|---|---|
| උදාහරණ 04ට | - | ලකුණු 04 | ලකුණු 15 යි |
| සමස්ත විස්තරයට | - | ලකුණු 11 | |

- **3, 4 යන ප්‍රශ්න සඳහා වන උත්තරයක වචන 125ක් පමණ තිබීම සෑහේ.**

**3. උත්තරෝලිය වස්තුව රසවත් කතා පුවතක් ලෙස අගය කළ හැක්කේ,**
**(i) උචිත රචනෝපක්‍රම යොදා ගැනීම**
**(ii) විශ්වසනීයත්වය ගොඩනැගෙන ලෙස ඉදිරිපත් කිරීම**
**යන කරුණු නිසා ය. එක් කරුණකට උදහරණ දෙක බැගින් දක්වමින් පැහැදිලි කරන්න.**

**අපේක්ෂිත පිළිතුර**

(i) උචිත රචනෝපක්‍රම

* උපමා

- සංසාර නමැති සාගරේ
- ජාති ජරා ව්‍යාධි මරණ නමැති මහත් වූ රළ පතර බිඳීම් ඇති
- ලෝභ ද්වේෂ මෝහ මදමාන මාත්සර්ය නමැති චන්ඩ පරුෂ මකර සුංසුමාරාදීන් විසින් ගැවසීගත්තා වූ
- කෝප නමැති ගිනි ගත්තා වූ
- මාතුගාම නමැති උදක රාක්ෂසීන්ට වාසස්ථාන වූ

* කෙටි වැකි

- "සමහර විටෙක දියෙහි ගිලෙයි. ඉපිලෙයි."
- "එකල ඒ නිධානය මඳක් තැන් ඇවිත් ඉදිරියේ සිට ගත."
- "රාජ පුරුෂයෝ ඒ නිධානයෙහි පවත් රජ හට කියා යැවූහ."

* දිගු වැකි

- "එසේ හෙයින් යමෙක් ශීලාදී ගුණ ධර්මයන්ට පරම ප්‍රතිෂ්ඨාධර වූ බුදුන් දරු සුපිළිපන් ..............."

* අනුප්‍රාස ඇතුළු ශබ්ද ධ්වනි ඉදිරිපත් කිරීම

- ඒ නිධානය සියල්ලවුන්ට පෙනෙන සේ උතුරාලු වැව දියපිට පෙරළි පෙරළි ඔබැමොබැ දිවෙයි. සමහර විටෙකැ දියෙහි ගිලෙයි ඉපිලෙයි.
- ඒ දැක මනුෂ්‍යයෝ වෙන වෙනම අප ළඟට එවයි. අපගේ පිනෙක් ඇත්නම් අප ළඟට එවයි කිය කියා සිටියාහ. ඒ කුමාරයාගේ මව ද එසේ කිය කියා සිටියාහ.

* සංස්කෘත වචන බහුලව යෙදීම

- ශික්ෂාග්‍රහණ කාලය සම්ප්‍රාප්ත විය
- මාතුගාම නමැති උදක රාක්ෂසීන්ට
- රූප ශබ්දාදී පංචකාම කොට්ඨාස
- දිව්‍ය මනුෂ්‍යසම්පත්ති සංඛ්‍යාත සප්තරත්නමය වූ නෞකාවෙකින්

ii විශ්වසනීයත්වය ගොඩනැගෙන ලෙස ඉදිරිපත් කිරීම

- දිළිඳු ගොපලු දරුවාට කෑමට කටු අලයක් දීම
- නිධානය බැලීමට ගම්වැසියන් පැමිණීම
- නිධානය අත්පත් කර ගැනීමට ගම්මුන් උත්සුක වීම
- රජ දරුවන් සන්තක දෙය සොරාගත් විට අත්වන ඉරණම
- එක් අයෙකුට නිධානය ලැබීම නිසා අන් අය ඊර්ෂ්‍යා කිරීම
- රාජ ගෞරවයට පාත්‍ර වී සැප සම්පත් ලැබීම

උදාහරණ 04 ට ලකුණු 04 යි.
සමස්ත විස්තරයට ලකුණු 11 යි. (ලකුණු 15 යි)

**නැතහොත්**

**කාව්‍යශේඛර කතුවරයා,**

**(i) බමුණු සමාජය උපහාසයට ලක් කිරීම**

**(ii) උචිත අවස්ථා පමණක් තෝරා ගැනීම**
**ඉතා මැනවින් කර ඇති බව පෙනේ. නියමිත කොටසින් උදාහරණ දෙක බැගින් දක්වමින් පැහැදිලි කරන්න.**

*(ලකුණු 15 යි)*

i බමුණු සමාජය උපහාසයට ලක්කිරීම
- කහවණු දහසකින් සෑහීමට පත්නොවී තවදුරටත් වස්තුව සිඟාකෑම
  බමුණු ඒ දහස ලත් ...............
- අනුන්ගේ ධනය වියදම් කිරීම
  කළෝ වියදම් සිතූ මතකට
- මහලු වී තරුණ ළඳුන් පැතීම
  එසඳ දැක මහලු කර මදහස

ii උචිත අවස්ථා පමණක් තෝරා ගැනීම
- ධනය මිතුරා ළඟ තබායෑම
  බමුණු එ දහස ලත් ...............
- ආපසු පැමිණ මුදල් ඉල්ලීම
  ඇවිදින් දද මහලු
- මුදල් දීමට නොහැකි බව පැවසීම
  නුවෙන් අප අයැති
- හිලව්වට දුව සරණ පාවා දෙන බව පැවසීම
  සිලව් කොට ඒ යළි එකෙක් ඇති
- මහලු බමුණා එයට එකඟ වීම
  සොඳයි පාවා ගනිමි මනකල

උදාහරණ 04 සඳහා ලකුණු 04 යි.
සමස්ත විස්තරයට ලකුණු 11 යි. (ලකුණු 15 යි)

මෙම උදාහරණ හෝ වෙනත් උචිත කරුණු දක්වා ඇත්නම් අදාළ ලකුණු දෙන්න.

**පිළිතුරු සැපයීම පිළිබඳ නිරීක්ෂණ හා නිගමන**

මෙම ප්‍රශ්නය 86%ක් පමණ අපේක්ෂකයන් විසින් තෝරා ගනු ලැබ ඇත. ප්‍රශ්නයට හිමි මුළු ලකුණු 15කි. ඉන්
ලකුණු 0 - 3ත් (0 - 25%) අතර 30%ක් ද
ලකුණු 4 - 7ත් (26 - 50%) අතර 28%ක් ද
ලකුණු 8 - 11ත් (51 - 75%) අතර 26%ක් ද
ලකුණු 12 - 15ත් (76 - 100%) අතර 16%ක් ද වශයෙන් ලකුණු ලබා තිබිණි.

ලකුණු ලබා ගැනීමේ දී අපේක්ෂකයින්ගෙන් බහුතරයක් මධ්‍යස්ථ ලකුණු මට්ටමක විය. මෙම ප්‍රශ්නය ප්‍රශ්න දෙකකින් සමන්විත වූ අතර එක් ප්‍රශ්නයක් තෝරාගෙන පිළිතුරු සැපයිය යුතු විය. ඒ අනුව පළමු ප්‍රශ්නය සඳහා 42%ක් අතර ප්‍රමාණයක් සාර්ථක පිළිතුරු සපයා තිබුණු අතර දෙවන ප්‍රශ්නය සඳහා 56%ත් 74%ත් අතර ප්‍රමාණයක් සාර්ථක ව පිළිතුරු සපයා තිබුණි. ප්‍රශස්ත ලකුණු මට්ටම අපේක්ෂකයින් අඩු සංඛ්‍යාවකට හිමි වී තිබූ අතර සිසුන්ගෙන් සැලකිය යුතු ප්‍රමාණයක් අඩු ලකුණු මට්ටමක සිටි බව පැහැදිලි ය.

ඒ අනුව සාහිත්‍ය රසාස්වාදය සඳහා ශිෂ්‍ය කුසලතා වර්ධනය කළ යුතු අතර ඔවුන් තුළ පුරාතන ගද්‍ය පද්‍ය කෘති පරිශීලනය කිරීමට වැඩි නැඹුරුවක් ඇති කිරීමට ද අවශ්‍ය පියවර ගත යුතුය. එයට අමතරව ප්‍රශ්නයට අදාළ ව පිළිතුරු සංවිධානය කිරීමේ පරිචයක් ද සිසුන් තුළ වර්ධනය කිරීම අවශ්‍ය වේ.

04 ප්‍රශ්නය

**4. "අපටත් දවසක ඉර පායාදෝ" කෙටි කතාව තුළින් කතුවරයා උත්සාහ ගෙන ඇත්තේ,**

**(i) දිළිඳු සමාජය පත් ව ඇති පීඩාකාරී වාතාවරණය**

**(ii) ධනවත් සමාජය අයුතු ලෙස වරප්‍රසාද ලබා ගැනීමට ගන්නා උත්සාහය**

**යන කරුණු අතරට මැදි වන දරුවකුගේ සංවේදී හැඟීම් විස්තර කිරීමට ය. එක් කරුණකට උදාහරණ දෙක බැගින් දක්වමින් විස්තර කරන්න.**

අපේක්ෂිත උත්තරය

i
- පහුවදා සෙයිලමට යන්නේ කාගෙන් හරි සල්ලි ඉල්ලා ගෙන
- සෝමා ඇඳල ඉවර වෙනකල් මං බලාගෙන හිටියේ පාට කුරක් ඉල්ලා ගන්නයි.
- මේ පොඩි එකාගේ පිටි ඉවර වෙලා ................. මං දෙයියන්නාන්සේට කිය කියා හිටියේ බොට පාට
- මැනිජරුන්නැහැ ළඟ හාල් පොතක් කියලා ගෙනාවේ ඒක ලුණු ටිකක් විකුණලාවත් බේරගන්නවා.
- ඩිරෙක්ටර් මගේ හස්බන් බව ඔයා දන්නැද්ද?
- මට කේන්තිය කලින් කියලා තිබිලත් මෙහෙම කරපු එකට .................. හැබැයි වැඩිකල් කරන්නාරින්නෑ
- වනසිංහ ටීචර් දක්සිගේ ............... අතින් අල්ලාගෙන ආට් කාමරේ පැත්තට යනවා ..............
- අසරණ අපට ඔය පර්වත එක්ක හැප්පෙන්න බෑ.

| | |
|---|---|
| උදාහරණ සඳහා | ලකුණු 04 යි |
| සමස්ත විස්තරයට | ලකුණු 11 යි |

එකතුව ලකුණු 15 යි

**මෙම උදාහරණ හෝ වෙනත් උචිත කරුණු දක්වා ඇත්නම් අදාළ ලකුණු දෙන්න.**

**නැතහොත්**

**මඟුල් ප්‍රස්තාව නාට්‍යයේ සාර්ථකත්වයට හේතු වී ඇත්තේ,**

**(i) කුතුහලය ජනනය වන අවස්ථා ඉදිරිපත් කිරීම**

**(ii) හාස්‍යය මතු කිරීමට ගන්නා උත්සාහය**

**යන කරුණු ය. නාට්‍යයේ පෙළ ඇසුරෙන් එක් කරුණකට උදාහරණ දෙක බැගින් දක්වමින් විස්තර කරන්න.*(ලකුණු 15 යි)***

අපේක්ෂිත උත්තරය

I ලව්නේරිස් තෙපාලිස්ගේ නිවසට පැමිණීම
- අද මොකද මේ හැටි උජාරුවට මේ ළමයා ඇඳ පැළඳ ගෙන එහෙම?
- ලව්නේරිස් හමුවීමට නන්දාවති පැමිණීම
  තාත්තා කිව්වේ බඩු වගයක් ගන්න කවුදෝ මුදලාලි කෙනෙක් ඇවිල්ලා ඉන්නවයි කියලා
- වල්ලායා සහ හඳයා පිළිබඳ ඇති වූ කතාබහ
- ලව්නේරිස් මියගොස් ඇතැයි සිතා කෙරෙන ප්‍රකාශ

II
- තෙපාලිස්ගේ නිවසට පැමිණි ලව්නේරිස් හැසිරෙන ලැජ්ජාශීලි ස්වභාවය හා කරන කතා බහ
- පැමිණි කාරණය අමතක කොට වෙනත් කරුණු කතාකිරීම
- විවිධ මාතෘකා ඔස්සේ රණ්ඩු කරමින් සිට මැරුණු බව සිතා ඉකිබිඳ හැඬීම
- හදිසියේම විවාහය සිදුකිරීමට තීරණය කිරීම

| | |
|---|---|
| උදාහරණ සඳහා | ලකුණු 04 යි |
| සමස්ත විස්තරයට | ලකුණු 11 යි |

එකතුව ලකුණු 15 යි

**පිළිතුරු සැපයීම පිළිබඳ නිරීක්ෂණ හා නිගමන**

මෙම ප්‍රශ්නය 93%ක් පමණ තෝරාගෙන තිබිණි. මෙය අනිවාර්ය ප්‍රශ්නයක් වූ අතර නිර්දිෂ්ට ග්‍රන්ථ දෙකක් ඇසුරෙන් ඉදිරිපත් කළ ප්‍රශ්න දෙකෙන් එකක් තෝරාගෙන පිළිතුරු සැපයීමේ ඉඩකඩ සිසුන්ට ලැබී තිබිණි. මෙම ප්‍රශ්නයට හිමි මුළු ලකුණු 15කි. ඉන්

| | |
|---|---|
| ලකුණු 0 - 3ත් (0 - 25%) අතර | 16%ක් ද |
| ලකුණු 4 - 7ත් (26 - 50%) අතර | 21%ක් ද |
| ලකුණු 8 - 11ත් (51 - 75%) අතර | 30%ක් ද |
| ලකුණු 12 - 15ත් (76 - 100%) අතර | 33%ක් ද වශයෙන් ලකුණු ලබා තිබිණි. |

මෙම ප්‍රශ්නය සඳහා අපේක්ෂකයින් ලබාගෙන තිබූ ලකුණු ප්‍රශස්ත මට්ටමක පැවැති අතර සමස්තයක් වශයෙන් 50%කට වැඩි ප්‍රමාණයක් සාර්ථකව පිළිතුරු සපයා තිබුණි. නූතන ගද්‍ය පද්‍ය පිළිබඳ සිසුන් වැඩි රුචියක් දක්වන බවත් පිළිතුරු ලිවීමේ දී නිර්දිෂ්ට ග්‍රන්ථ බොහෝ දුරට පරිශීලනය කර ඇති බවත් පැහැදිලි වේ.

සාහිත්‍ය කෘති ඇසුරෙන් සැකැසුණු ප්‍රශ්නවලට පිළිතුරු ලිවීමේ දී ප්‍රශ්නවලට අනුකූල හා උචිත වන සේ පිළිතුරු ගොනු කරගත යුතු ආකාරය පිළිබඳ ව සිසුන් දැනුවත් කිරීම අවශ්‍ය වන අතර ඔවුන් නිරන්තර අභ්‍යාසවල යෙදවීම ද යෝග්‍ය වේ.

05 ප්‍රශ්නය

- **5, 6, 7 ප්‍රශ්නවලින් එකකට පමණක් උත්තර ලියන්න. උත්තරයක වචන 100 ක් පමණ තිබීම සෑහේ.**

**5.** **'වැස්ස නිසා පරිසරයේ ඇති වන සුවිශේෂතා ප්‍රතිනිර්මාණය කිරීමෙහි ලා කවියා දක්වන්නේ අපූර්ව කුසලතාවකි.' වැස්ස කුවිපෙළ ඇසුරෙන් උදහරණ තුනක් දක්වමින් විස්තර කරන්න.** ***(ලකුණු 10 යි)***

අපේක්ෂිත උත්තරය

වැසි අවස්ථාවක දී දක්නට ලැබෙන දර්ශන ඉදිරිපත් කිරීම.

* අහසේ වලාකුළු හා තරගයක යෙදී
* පදමට වෙරළුම්ණිකැට සුණු විසුළ හැඩ
* දිය වැල් වමාරන්නා මෙනි පියසි තල
* පිඹුරන් සේ ඇදෙයි ගුරු පැහැ දිය දාරා
* ගස්වැල් තිගැස්සෙයි මේ කුළු ගැටෙන හඬින්
* ඇළ දොළ ගලා බස්වන්නට ඉවුරු කඩා
* මිදුලේ පුංචි ගංගාවල් ගලන කල

වහින විට ස්වභාවික වස්තු මෙන්ම සජීවි සත්ත්වයින්ද දක්වන ප්‍රතිචාර

- "නැහැ පුදු මහත්කොට මී ගොන් මුළුව නැඩ"
- "මට මහ සොම්නසක් ඇත මොනරෙකුට වඩා"
- "සිතුවිලි වලට මුළු හදවතම ඉඩ මදි"
- "පාසල් ළමයි පාවෙති සිය සිහින වල"

| | | |
|---|---|---|
| උදාහරණ සඳහා ලකුණු | 03 යි | |
| සමස්ත විස්තරයට ලකුණු | 07 යි | එකතුව ලකුණු 10 යි. |

**පිළිතුරු සැපයීම පිළිබඳ නිරීක්ෂණ හා නිගමන**

මෙම ප්‍රශ්නය තෝරාගෙන ඇත්තේ අපේක්ෂකයන්ගෙන් 77%ක් පමණි. මෙම ප්‍රශ්නයට හිමි මුළු ලකුණු 10කි. ඉන් ලකුණු 0 - 2ත් (0 - 25%) අතර 15%ක් ද
ලකුණු 3 - 5ත් (26 - 50%) අතර 21%ක් ද
ලකුණු 6 - 7ත් (51 - 75%) අතර 30%ක් ද
ලකුණු 8 - 10ත් (76 - 100%) අතර 34%ක් ද වශයෙන් ලකුණු ලබා තිබිණි.

අපේක්ෂකයන්ගෙන් 62%ක් පමණ සාර්ථකව පිළිතුරු සපයා තිබිණි. පැරණි සාහිත්‍යයට වඩා නූතන සාහිත්‍යය පිළිබඳ ව සිසුන්ගේ යම් පමණ හෝ වැඩි ඇල්මක් ඇති බව මෙයින් පෙනුණි. වැස්ස නිසා පරිසරයේ ඇතිවන සුවිශේෂතා වඩාත් මැනැවින් තහවුරු කිරීම සඳහා යෝග්‍ය කවි ම නිදසුන් වශයෙන් තෝරා ගැනීම සඳහා සිසුන් දැනුවත් කළේ නම් ඉහළ ලකුණු ප්‍රමාණයක් ලබාගත හැකිව තිබිණි. එසේම වින්දනාත්මකව නිදසුන් ඉදිරිපත් කිරීම සඳහා ද අපේක්ෂකයන් හුරු කළ යුතුය.

**ප්‍රශ්න අංකය - 06**

**ව්‍යුහය**

මෙම ප්‍රශ්නයට උදාහරණ තුනක් සහිතව රචනාමය වර්ගයේ පිළිතුරක් සැපයිය යුතුව තිබුණි. මෙය තෝරාගත යුතුව තිබූ ප්‍රශ්නවලින් එකකි.

**6. ශ්‍රද්ධා භක්තියෙන් දෙන ඉතා සුළු දානයක් වුවත් මහත්ඵල මහානිසංස ලබාදෙන අයුරු මනාව විදහා දක්වමින් රසික සිත් ඇදබැඳ තබා ගැනීමට කතුවරයා සමත් වී ඇති ආකාරය සද්ධර්මාලංකාරයේ නියමිත කොටසින් උදාහරණ තුනක් දක්වමින් පැහැදිලි කරන්න.** *(ලකුණු 10 යි)*

**අපේක්ෂිත උත්තරය**

කටු අලය දන්දුන් දරුවා වෙනුවෙන් ඊළඟ ආත්මභාවයේ දී

- නිධානයක් පහළ වීම
- එම නිධානයක් පහළ වීම
- රජතුමාගෙන් නොයෙක් සැප සම්පත් ලැබීම
- ආයු කෙළවර දෙව්ලොව ඉපදීම හා දිව්‍ය සැපසම්පත් ලැබීම
- පිනෙන් ලැබෙන ආනිශංස කිසිවකුට පැහැරගත නොහැකිය

ඉහත දැක්වෙන කරුණු කෙරෙහි විශේෂ අවධානය යොමුකරමින් උදාහරණ 3ක් වත් විස්තර කර ඇත්නම් ඉහළ ලකුණක් ප්‍රදානය කරන්න. පොතේ උපුටන ඒ ආකාරයෙන්ම නැතත් විස්තර කර ඇත්නම් ලකුණු පිරිනමන්න.

| | | |
|---|---|---|
| උදාහරණ අවස්ථා සඳහා | ලකුණු 03 යි | |
| සමස්ත විස්තරයට | ලකුණු 07 යි | (එකතුව ලකුණු 10 යි) |

**පිළිතුරු සැපයීම පිළිබඳ නිරීක්ෂණ හා නිගමන**

මෙම ප්‍රශ්නය තෝරා ගෙන ඇති සංඛ්‍යාව 8%ක් පමණ වේ.
5, 6, 7 ප්‍රශ්නවලින් එකක් තෝරාගත යුතු නිසා මෙම ප්‍රශ්නය තෝරා ගැනීමේ සංඛ්‍යාව අඩු වන්නට ඇතැයි සිතිය හැකිය.

මෙම ප්‍රශ්නයට හිමි ලකුණු 10කි. ඉන් ලකුණු 0 - 2ත් (0 - 25%) අතර 28%ක් ද
ලකුණු 3 - 5ත් (26 - 50%) අතර 30%ක් ද
ලකුණු 6 - 7ත් (51 - 75%) අතර 24%ක් ද
ලකුණු 8 - 10ත් (76 - 100%) අතර 18%ක් ද
වශයෙන් ලකුණු ලබා තිබිණි.

ප්‍රශ්නයට පිළිතුරු සපයා තිබූ සංඛ්‍යාවෙන් බහුතරයක් මධ්‍යස්ථ මට්ටමක ලකුණු ලබාගෙන තිබුණු අතර සාර්ථක ලෙස පිළිතුරු සපයා තිබුණේ 32%ක පමණ ප්‍රමාණයකි. පුරාතන කෘති පරිශීලනය කිරීම සඳහා සිසු නැඹුරුව වර්ධනය කිරීමත්, නිරන්තරාභ්‍යාස කෙරෙහි පෙලඹවීමක් අවශ්‍ය වේ.

07 ප්‍රශ්නය

**7.** **"ස්වාර්ථය පමණක් ප්‍රාර්ථනය කරන්නා මහත් වූ ව්‍යසනයන්ට මං පෙත් විවර කර දෙන අයුරු සිත් කාවදින ආකාරයෙන් කියාපෑමට ගත් සාර්ථක උත්සාහයක් ලෙස වේදබ්බ ජාතකය අගය කළ හැකි ය." උදාහරණ තුනක් දක්වමින් පැහැදිලි කරන්න.** *(ලකුණු 10 යි)*

අපේක්ෂිත උත්තරය

* වේදබ්බ බමුණා සොරුන්ගෙන් මිදීමේ අරමුණින් සොරුන්ට වස්තුව ලබාදීම නිසා විනාශයට පත්වීම.
* දෙවන සොරු කණ්ඩායම වස්තුව ලබා ගැනීම සඳහා පළමුවන සොරු කණ්ඩායම විනාශයට පත් කිරීම.
* දෙවන සොරු කණ්ඩායමට වස්තුව අත්කර ගැනීම සඳහා ඔවුනොවුන් විනාශ කිරීම.
* අවසානයේ වස්තුව හිමිකරගත් සොරුන් දෙදෙනා ද වස්තුව තනි තනිව හිමි කර ගන්නට ඔවුනොවුන් විනාශ කිරීම.
* ස්වාර්ථය පතන්නා තමාට හිතවත් වූ අයෙකු දෙන අවවාද පවා නොතකා හැරීම.
* ස්වාර්ථය පතන්නා බුද්ධිමත්ව සිතා බලා කටයුතු නොකිරීම.

(ඉහත කරුණු අනුව සිද්ධි එකිනෙක ගළපා ඉදිරිපත් කර තිබීමත්, කතා සන්දර්භයේ ඇති සුවිශේෂී බව විස්තර කර තිබීමත් අවශ්‍ය ය.)

| | | |
|---|---|---|
| උදාහරණ අවස්ථා සඳහා | ලකුණු 03 යි | |
| සමස්ත විස්තරයට | ලකුණු 07 යි | (එකතුව ලකුණු 10 යි) |

**පිළිතුරු සැපයීම පිළිබඳ නිරීක්ෂණ හා නිගමන**

මෙම ප්‍රශ්නය තෝරා ගෙන ඇති සංඛ්‍යාව 8%ක් පමණ වේ.
5, 6, 7 ප්‍රශ්නවලින් එකක් තෝරා ගැනීමට සිසුන්ට අවකාශ දී තිබූ හෙයින් තෝරාගත් සංඛ්‍යාව අඩු වන්නට ඇතැයි අනුමාන කළ හැකිය. මෙම ප්‍රශ්නයට හිමි ලකුණු 10කි. ඉන්

| | | |
|---|---|---|
| ලකුණු 0 - 2ත් (0 - 25%) අතර | 18%ක් ද | |
| ලකුණු 3 - 5ත් (26 - 50%) අතර | 34%ක් ද | |
| ලකුණු 6 - 7ත් (51 - 75%) අතර | 32%ක් ද | |
| ලකුණු 8 - 10ත් (76 - 100%) අතර | 16%ක් ද | වශයෙන් ලකුණු ලබා තිබිණි. |

පිළිතුරු සපයා තිබූ සංඛ්‍යාවෙන් බහුතරයක් මධ්‍යස්ථ ලකුණු ලබාගෙන තිබිණු බව දක්නට ලැබෙන අතර 46%ක පමණ ප්‍රමාණයක් සාර්ථක ලෙස පිළිතුරු සපයා තිබුණු බව ප්‍රස්තාර 4 අනුව පැහැදිලි වේ. ප්‍රශස්ත ආකාරයෙන් පිළිතුරු ගොනු කර ගැනීමේ කුසලතාව සිසුන් තුළ වර්ධනය කළ යුතු අතර ඒ සඳහා නිර්දිෂ්ට ග්‍රන්ථ පරිශීලනය කිරීමේ අවශ්‍යතාව පිළිබඳව ද අවධාරණය කළ යුතුය.

සාහිත්‍ය ග්‍රන්ථ රස වින්දනයත්, ප්‍රශ්නයට උචිත ලෙස පිළිතුරු ගොනු කර ගැනීමත් පිළිබඳ ව මනා හැකියාවක් සිසුන් තුළ ගොඩ නැගීම අත්‍යවශ්‍ය වේ.

## III කොටස

**3.0 පිළිතුරු සැපයීමේ දී සැලකිලිමත් විය යුතු කරුණු හා යෝජනා :**

**3.1. පිළිතුරු සැපයීමේ දී සැලකිලිමත් විය යුතු කරුණු :**

**පොදු උපදෙස් :**

* ප්‍රශ්න පත්‍රයේ ඇති මූලික උපදෙස් කියවා හොඳින් තේරුම් ගත යුතුය. එනම් එක් එක් කොටසින් කොපමණ ප්‍රශ්න සංඛ්‍යාවකට පිළිතුරු සැපයිය යුතු ද? කුමන ප්‍රශ්න අනිවාර්යය ද? කොපමණ කාලයක් ලැබේ ද? කොපමණ ලකුණු ලැබේ ද? යන කරුණු පිළිබඳ ව සැලකිලිමත් විය යුතු අතර ප්‍රශ්න හොඳින් කියවා නිරවුල් අවබෝධයක් ඇති කර ගෙන ප්‍රශ්න තෝරා ගත යුතුය.

* I පත්‍රයේ ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමේ දී වඩාත් නිවැරදි **එක්** පිළිතුරක් තෝරා ගත යුතුය. තවද පැහැදිලිව එක් කතිර ලකුණක් පමණක් යෙදිය යුතුය.

* II පත්‍රයේ ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමේ දී සෑම ප්‍රධාන ප්‍රශ්නයක්ම අලුත් පිටුවකින් ආරම්භ කළ යුතුය.

* නිවැරදි හා පැහැදිලි අත් අකුරුවලින් පිළිතුරු ලිවිය යුතුය.

* අයදුම්කරුගේ විභාග අංකය සෑම පිටුවකම අදාළ ස්ථානයේ ලිවිය යුතුය.

* ප්‍රශ්න අංක හා අනු කොටස් නිවැරදිව ලිවිය යුතුය.

* නිශ්චිත කෙටි පිළිතුරු ලිවීමට අවශ්‍ය අවස්ථාවල දී දීර්ඝ විස්තර ඇතුළත් නොකිරීම මෙන්ම විස්තරාත්මක පිළිතුරු සැපයිය යුතු අවස්ථාවල දී කෙටි පිළිතුරු සැපයීම ද නොකළ යුතුය.

* ප්‍රශ්නය අසා ඇති ආකාරය අනුව තර්කානුකූලව හා විශ්ලේෂණාත්මකව කරුණු ඉදිරිපත් කළ යුතුය.

**විශේෂ උපදෙස් :**

* අත් අකුරු සහ අක්ෂර වින්‍යාසය පිළිබඳ ව විශේෂයෙන් සැලකිලිමත් විය යුතු ය.

* ශිල්පීය දක්ෂතා (පද බෙදීම, විරාම ලක්ෂණ, ඡේද අදාළ පරිදි වෙන් කොට තිබීම) යන අංශ පිළිබඳ ව විශේෂයෙන් සැලකිලිමත් විය යුතු ය.

3.2 **ඉගෙනුම් හා ඉගැන්වීම් පිළිබඳ අදහස් හා යෝජනා :-**

* අත් අකුරුවල අපැහැදිලි බව, අකුරුවල කොටස් අඩුවීම, විරාම ලක්ෂණ භාවිතය ආදී දුර්වලතා මගහැරවීමට ප්‍රාථමික පන්තිවල සිට ම සිසුන් දැනුවත් කිරීම සහ අත් අකුරු ලිවීමේ අභ්‍යාසවල වඩ වඩාත් යෙදවීම කළ යුතුය.

* අක්ෂර වින්‍යාසය පිළිබඳව නිවැරදි අවබෝධයක් ලබාදීම සඳහා හේතු සහිතව එම රීති ඉගැන්විය යුතුය.

* ඉඟිවැකි, ප්‍රස්තාව පිරුළු සහ උක්තාඛ්‍යාත පද සම්බන්ධය පිළිබඳ ව අවබෝධයක් ලබාදීම සඳහා අදාළ පාඩම් ඉතා සරල අභ්‍යාසවලින් ආරම්භ කර ගැඹුරු අභ්‍යාස කරා සිසුන් යොමු කළ යුතුය.

* රචනා, විචාර හා රස වින්දන පිළිතුරුවලින් ප්‍රදර්ශනය විය යුතු විශ්ලේෂණ හැකියාව ඇතුළු චතුර්විධ භාෂා කුසලතා වර්ධනය කරවීම සඳහා බාහිර පොතපත පරිශීලනයට මෙන්ම විද්‍යුත් සන්නිවේදනය ඇතුළු වෙනත් සන්නිවේදන මාධ්‍ය පරිශීලනය සඳහා ද සිසුන් යොමු කළ යුතු ය.

* සංශ්ලේෂණ හැකියාව මැනෙන සාරාංශකරණයට හුරු කරවීම සඳහා අනිවාර්යයෙන් ම සාරාංශකරණ අභ්‍යාසවල යෙදවිය යුතු ය.

* රචනා හා රසවින්දනාත්මක පිළිතුරුවලින් ගම්‍යමානවන ස්මරණ ශක්තිය දියුණු කිරීම සඳහා 10, 11 ශ්‍රේණිවල මුල් වාරවල දී ගද්‍ය පද්‍ය කොටස් කටපාඩම් කරවීමට යොමු කළ යුතු ය.

* අර්ථාවබෝධය, ලිවීමේ දුර්වලතා මග හරවා ගැනීම සඳහා සතතාභ්‍යාසයේ යෙදවිය යුතුය.

* නිර්දිෂ්ට ග්‍රන්ථ හා කතුවරුන් පිළිබඳ ව තොරතුරු එක්රැස් කර විය යුතුය.

* රාජකාරි ලිපි, ව්‍යාපාරික ලිපි ඇතුළුව ලිපි ලිවීමේ අඩුපාඩු සකස් කිරීම සඳහා ඒවායේ ආකෘති පිළිබඳ මූලික අවබෝධයක් ලබාදිය යුතුය.

* පුවත්පත් වාර්තා ලිවීම වැනි ප්‍රායෝගික කුසලතා ප්‍රවර්ධනය කරවීම සඳහා ප්‍රායෝගික ලෙස පුවත්පත්වලට ලිපි ලිවීමේ අවස්ථා උදාකර දිය යුතුය.

* භාෂාව ඉගැන්වීමේ දී සාම්ප්‍රදායික ක්‍රමවලට වඩා නූතන විධි ක්‍රම අනුගමනය කළ යුතුය. මෙහිදී සාමාන්‍ය ව්‍යවහාරයේ පවතින උදාහරණ පිළිබඳව විශේෂ අවධානය යොමු කළ යුතුය.

* භාෂාවේ නව ප්‍රවණතා හා වෙනස්කම් හඳුනාගෙන ඒවා සජීවී ලෙස ඉගැන්වීමේ කාර්ය සඳහා යොදාගත යුතුය. (නිදසුනක් ලෙස වත්මන් ව්‍යවහාර භාෂාව උපයෝගී කරගෙන සන්ධි පාඩම ඉගැන්විය යුතුය.)

* සංවේදී බවෙන් හා රසඥතාවෙන් පිරිපුන් රසිකයකු බිහිකිරීමෙහිලා සාහිත්‍යයෙන් සිදුවනුයේ අපමණ මෙහෙයකි. එවන් පුද්ගලයින් සමාජයට මහගු සම්පතකි. සමාජය මිනිස්කමින් පුරවන්නට නම් සාහිත්‍යය කෙරෙහි වඩාත් හොඳින් සිසුන් යොමු කරවීම කාලීන අවශ්‍යතාවකි. මේ පිළිබඳ ගුරුභවතුන් ඇතුළු අදාළ බලධාරීන්ගේ අවධානය යොමු විය යුතුය.